# උක් පර්යේෂණ ආයතනය

## ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය

## උඩවලව, ශ්‍රී ලංකාව

දුරකථන - +94472233281, +94472233285, ෆැක්ස් - +94472233233

විද්‍යුත් තැපැල - info@sugarres.lk වෙබ් අඩවිය - www.sugarres.lk

**කොළඹ කාර්යාලය**

**(2017 මැයි මස 11 දක්වා)**

අංක 276, පහලවෙල පාර, බත්තරමුල්ල

දුරකථන -+94114389152, ෆැක්ස් -+94112785796

**සභාපති**

දුරකථන -+94114389150, ෆැක්ස් -+94112785796

**කොළඹ කාර්යාලය**

**(2017 මැයි මස 12 සිට)**

අංක 21 ඒ, පාලාවත්ත පාර, තලංගම (දකුණ)

**සභාපති**

දුරකථන -+94114389150, ෆැක්ස් -+94112785796

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**

දුරකථන - +94474937335, ෆැක්ස් - +94472233282

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
සී කොටස, 11 වෙනි මහල,
සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

## 2017.01.01 සිට 2017.12.31 දක්වා කාලය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව

2017.01.01 සිට 2017.12.31 දක්වා කාලය සඳහා උක් පර්යේෂණ ආයතනයේ ප්‍රගතිය, එම මුදල් වර්ෂය වෙනුවෙන් වූ අවසන් ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව ද අඩංගුකොට, ඉහත වාර්ෂික වාර්තාව සමග ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී වූ,

උක් පර්යේෂණ ආයතනය

කේ. ඒ. එෆ්. කරුණාසේන
සභාපති
පාලක මණ්ඩලය
2018.05.30 දින

# පටුන


| | පිටු අංකය |
|---|---|
| දැක්ම | 01 |
| මෙහෙවර | 01 |
| පාලක මණ්ඩලය | 02 |
| සභාපතිගේ සමාලෝචනය | 03 |
| අධ්‍යක්ෂගේ සමාලෝචනය | 05 |
| ආංශික වාර්තා | 10 |
| බෝග වැඩි දියුණු කිරීමේ අංශය | 12 |
| බෝග හා සම්පත් කළමනාකරණ අංශය | 16 |
| බෝග පෝෂණ අංශය | 20 |
| බෝග ආරක්ෂණ අංශය | 24 |
| යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය | 30 |
| සැකසුම් තාක්ෂණ අංශය | 34 |
| ආර්ථික විද්‍යා, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශය | 38 |
| තාක්ෂණ සම්ප්‍රේෂණ සහ සංවර්ධන අංශය | 42 |
| ප්‍රකාශන | 51 |
| පරිපාලන සහ මුදල් අංශය | 52 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 60 |
| විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 62 |
| විගණකාධිපති වාර්තාව | 76 |
| 2013 සිට 2017 දක්වා ප්‍රධාන මූල්‍ය තොරතුරු | 87 |

## දැක්ම

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්ත තාක්ෂණයන් සම්බන්ධ විශිෂ්ටතම ආයතනය සහ එම කර්මාන්තය දියුණු කිරීමේ ප්‍රමුඛයා වීම

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයෙහි තරඟකාරීත්වය ඉහළ නැංවීම සහ එය වඩාත් පුළුල්කර චිරස්ථායි ලෙස සංවර්ධනය කිරීමට දායකත්වය ලබාදීම සඳහා සුදුසු තාක්ෂණයන් නිපදවීම සහ ප්‍රචාරණය කිරීම

# පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| කේ. ඒ. එෆ්. කරුණාසේන මහතා | - | පත්කළ සාමාජික (සභාපති) |
| ඇන්. වී. ටී. ඒ. වේරගොඩ මහතා | - | පත්කළ සාමාජික |
| මහාචාර්ය ඒ. එල්. ටී. පෙරේරා | - | පත්කළ සාමාජික |
| ටී. වී. ඩී. ධර්මසිරි මහතා | - | පත්කළ සාමාජික |
| ජේ. පී. ඒ. නිරෝශනී මිය | - | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ නියෝජිත (2017.02.14 සිට) |
| එම්. ඒ. එම්. අරීෆා මිය | - | මුදල් අමාත්‍යාංශ නියෝජිත (2017.02.03 සිට) |
| එම්. ආර්. වී. ආර්. මීපුර මහතා | - | මුදල් අමාත්‍යාංශ නියෝජිත (2017.08.18 සිට) |
| ආචාර්ය ඒ. පී. කීර්තිපාල | - | අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්වන සාමාජික) |

## සභාපතිගේ සමාලෝචනය

සමාලෝචිත වර්ෂයතුළදී, උක් පර්යේෂණ ආයතනයට, එහි පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන සංවර්ධන කාර්යන් සඳහා, ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 325ක් සහ ආයතනීය අරමුදලින් රුපියල් මිලියන 121ක් ද වශයෙන්, රුපියල් මිලියන 446ක් වෙන්කර ඇත. පුනරාවර්තන වියදම් සඳහා වෙන්කෙරුණු මුළු ප්‍රතිපාදනය වූ රු. මිලියන 280, ඒකාබද්ධ අරමුදලින් රු. මිලියන 255ක් සහ ආයතනය විසින් ජනනය කරණලද අරමුදලින් රු. මිලියන 25ක් වශයෙන් සමන්විතවිය. ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනය රු. මිලියන 166ක් වූ අතර එය, ඒකාබද්ධ අරමුදලින් සෘජුවම මහා භාණ්ඩාගාරය හරහා වෙන්කළ රු. මිලියන 60ත්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කිලිනොච්චි සහ කන්තලේ ව්‍යපෘති සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් වෙන්කළ රු. මිලියන 10ක් සහ ආයතනය විසින් ජනනය කරණලද අරමුදලින් රු. මිලියන 96ක් වශයෙන් විය.

කෙසේ වෙතත්, 2017 වසර තුළ දී, මහා භාණ්ඩාගාරයෙන් ආයතනය වෙත ලැබුනේ රුපියල් මිලියන 232.83ක් පමණි. එම ප්‍රමාණය, පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 205.13ක් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 27.7ක් (රු. මිලියන 17.7ක් සෘජුවම භාණ්ඩාගාරයෙන් සහ කන්තලේ සහ කිලිනොච්චි ව්‍යාපෘතීන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 10ක් අමාත්‍යාංශය හරහා වශයෙන්) වශයෙන් විය. එබැවින්, ඒකාබද්ධ අරමුදලින් වෙන්කර තිබූ රු. මිලියන 92.7ක මුදල ආයතනය වෙත නොලැබුණි. එම තත්වය, ආයතනයේ කාර්යසාධනය, විශේෂයෙන්ම ආයතනයේ සංවර්ධන කටයුතු කෙරෙහි බලපාන ලදී.

ආයතනය විසින් අත්පත්කරගත් වෙසෙසි ජයග්‍රහණයන් අතර, නව වැඩිදියුණු කරන ලද උක් ප්‍රභේද 5ක් වාණිජ වගාවන්ට මුදාහැරීම, උක් වගාවන්හි තෘණ සහ පළල් පත්‍ර වල් මර්දනය සඳහා ඩයියුරෝන් 46.8% සහ හෙක්සසිනෝන් 13.2% මිශ්‍රණය යෙදීමට නිර්දේශකිරීම, උක් සුදු පත්‍ර රෝග වාහකයා පාලනය සඳහා උක් ඉඩම් මායිම්වලට ෆිප්රොනිල් යෙදීමට නිර්දේශ කිරීම, උක්වලින් කණිකාමය හකුරු නිපදවීමට ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම සහ උක් වගාකරීමේ ආදායම් වියදම් යාවත්කාලීන කිරීම වේ. දැනුම සම්ප්‍රේෂණය යටතේ, උක් වගාවේ විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ උපදෙස් පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා බෙදාහැරීම සහ කර්මාන්තශාලා ප්‍රදේශවල ක්ෂේත්‍ර ආදර්ශන 80ක් ස්ථාපිත කිරීමට අමතරව, පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 53ක්, ගොවීන් සඳහා ක්ෂේත්‍ර දිනයක්, ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 12ක් සිදුකිරීම ප්‍රධාන වේ. කුඩා පරිමාණ උක් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් කර්මාන්ත සංවර්ධනය සඳහා තවාන් ස්ථාපනය කිරීම සහ ගොවි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. මීට අමතරව, උක් වගා කිරීම සහ පැණි සහ හකුරු නිෂ්පාදනය සඳහා උක් පර්යේෂණ ආයතනය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන්කරණ ලදී. තවද, අදාල සීනි කර්මාන්තායතන සමග ඒකාබද්ධව, සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශවල රෝග ආසාධිත තවාන් නීරෝගී බීජ උක් මගින් ප්‍රතිස්ථාපනය කිරීම පිණිස වැඩසටහනක් ආරම්භ කරනලදී.

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්වලට සහ කාර්ය මණ්ඩලයට අවශය පහසුකම් ලබාදීම සඳහා උඩවලව ප්‍රධාන මධ්‍යස්ථානය, සියඹලාණ්ඩුව ව්‍යාධිවේද ගොවිපළ, හන්තාන නිරෝධායන

මධ්‍යස්ථානය සහ එන්සල්වත්ත අභිජනන මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය අඛණ්ඩව සිදුකරනලදී. කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ සංවර්ධන නිලධාරී එක් අයෙකු බැගින් ද, පර්යේෂණ නිලධාරීන්, තාක්ෂණ නිලධාරීන් සහ කළමනකරණ සහකාරවරුන් දෙදෙනෙකු බැගින් ද වශයෙන් පුරප්පාඩු 8ක් පිරවීම සිදු කරනලදී. පර්යේෂණ, තාක්ෂණ සහ උපකාරක සේවා කාර්ය මණ්ඩලය ඉහළ නැංවීම පිණිස ආයතනයේ සේවක සංඛ්‍යා සංශෝධන ක්‍රියාවලිය ද අඛණ්ඩව සිදුකරනලදී. කාර්ය මණ්ඩල ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා අදාල නිලධාරීන්හට කෙටි කාලීන මෙන්ම දිගු කාලීන පුහුණු අවස්ථා ලබාදෙන ලදී. ඒ අතර, ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා මුදාහරින ලද ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ පර්යේෂණ නිලධාරීට අමතරව තවත් පර්යේෂණ නිලධාරියකු මුදාහැරීම සහ එක් පර්යේෂණ නිලධාරීයකුහට දර්ශනපති උපාධි පාඨමාලාවක් හැදෑරීම පිණිස මුදාහැරීම වේ. මීට අමතරව, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙකු, පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු, සංවර්ධන නිලධාරීන් දෙදෙනකු, සහකාර අධ්‍යක්ෂ (පාලන), පරිපාලන නිලධාරී, ගිණුම් නිලධාරී, තාක්ෂණ නිලධාරීවරයෙකු, සහ කළමනාකාරණ සහකාරවරුන් දෙදනකුහට අදාල විෂය ක්ෂේත්‍ර සම්බන්ධ විදේශ පුහුණු අවස්ථා ලබාදෙන ලදී. තවද, ආයතනයේ විවධ සේවා කාණ්ඩවල සේවකයින් සඳහා ඔවුනගේ රැකියාවේ විෂයපථයන්ට අදාලව දේශීය කෙටිකාලීන පුහුණු අවස්ථා ද ලබාදෙන ලදී.

ජානමය ද්‍රව්‍ය හුවමාරුව, සහයෝගීතා පර්යේෂණ, විද්‍යාඥයින් පුහුණුව සහ දැනුම බෙදාගැනීම සඳහා විද්‍යාඥයින් හුවමාරුව ඇතුලත් අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා උක් පර්යේෂණ ආයතනය, චීනයේ යුනාන්හි කෘෂිකාර්ම විද්‍යා ඇකඩමිය සහ එහි උක් පර්යේෂණ ආයතනයන් සමග ගිවිසුම්වලට එළඹිණි.  ඊට අමතරව පාකිස්ථානයේ ෆයිසිලාබාද් හි උක් පර්යේෂණ ආයතනය සමග සහයෝගීතා කටයුතු ආරම්භ කිරීමේ කාර්යයට අවශ්‍ය කටයුතු අඛණ්ඩව කරගෙනයන ලදී.

දේශීය සීනි කර්මාන්තයේ වර්තමාන සහ අනාගත සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ආයතනයේ සේවාවන් වඩාත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව උක් පර්යේෂණ ආයතන පනතෙහි විෂය පථය පළල් කිරිම සඳහා එය සංශෝධනය කිරීමේ කටයුතු ආරම්භකරණ ලදී.

ආයතනයේ කාර්යසාධනයට බලපෑ ප්‍රධාන බාධාවන් අතර, මූල්‍ය ප්‍රතිපාදන නිසි වේලාවට නොලැබීම, විශේෂයෙන්ම විද්‍යාත්මක සහ ඉහළ කළමනාකරණ තනතුරුවල පුහුණු කාර්ය මණ්ඩලයේ හිඟකම සහ ඉහළ ගුණාත්මයෙන් යුතු කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ සහ රඳවා ගනීමේ අපහසුතාවය ප්‍රධාන වේ.

කේ. ඒ. එෆ්. කරුණාසේන
සභාපති

# අධ්‍යක්ෂගේ සමාලෝචනය

උක් සම්බන්ධ නව දැනුම/තාක්ෂණයන් ජනනය පිණිස පර්යේෂණ පැවැත්වීම, නව දැනුම සීනි කර්මාන්තායතන, ගොවීන් සහ අනෙකුත් අදාල පාර්ශවයන් වෙත සම්ප්‍රේෂණය කිරීම, පදනම් බීජ උක් නිෂ්පාදනය සහ සැපයීම, කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත සඳහා උක් වගාව ව්‍යාප්ත කිරීම මගින් උක් පර්යේෂණ ආයතනය 2017 වසර තුළදී ද සිය කාර්යයන් අඛණ්ඩව සිදුකරන ලදී. දේශිය සීනි කර්මාන්තයේ සංවර්ධන අවශ්‍යතා සපුරාලීම අරමුණුකරගත් උක් පර්යේෂණ ආයතනයේ දිගු කාලීන පර්යේෂණ වැඩසටහන, උක් බෝග වැඩි දියුණු කිරීම, බෝග සහ සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය, බෝග ආරක්ෂණය, ගොවිපළ යාන්ත්‍රීකරණය සහ සැකසුම් සහ නිෂ්පාදන සංවර්ධනය යන අංගවලින් සමන්විත විය. පර්යේෂණ වැඩසටහන මගින් ජනනයවන නව දැනුම/තාක්ෂණයන්, සීනි කර්මාන්තායතන, ගොවීන් සහ අනෙකුත් අදාල පාර්ශවයන්වෙත ගෙනයාමට තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. උක් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත නව උක් ප්‍රභේදවල පදනම් බීජඋක් නිෂ්පාදනය, අදාල සීනි කර්මාන්තායතන සමග ඒකාබද්ධව, සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශවල රෝග ආසාධිත තවාන් නීරෝගී බීජ උක් මගින් ප්‍රතිස්ථාපනය කිරීම සහ සීනි කර්මාන්තශාලා නොමැති ප්‍රදේශවල කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත ඇතිකිරීම සඳහා එම ප්‍රදේශවල උක් වගාව ව්‍යාප්ත කිරීම ආදිය සංවර්ධන වැඩසටහනක් මගින් සිදුකරනලදී.

වර්ෂ 2000 දී අභිජනනය කෙරුණු නව වැඩි දියුණු කරනලද උක් ප්‍රභේද 4ක් සහ 2004 දී අභිජනනය කෙරුනු එක් ප්‍රභේදයක් වාණිජ වගාව සඳහා නිරදේශකර මුදාහැරීම, බෝග වැඩි දියුණු කිරීමේ අංශය විසින් අත්පත්කරගත් වඩා වැදගත්ම ජයග්‍රහණයකි. එස්. එල්. 00 95, එස්. එල්. 00 354, එස්. එල්. 00 603 සහ එස්. එල්. 00 652, 2000 දී අභිජනනය කරනලද ප්‍රභේද වේ. මින්, එස්. එල්. 00 95, එස්. එල්. 00 603 සහ එස්. එල්. 00 652 යන උක් ප්‍රභේද වර්ෂා පෝෂිත සහ වාරි පෝෂිත තත්ව සඳහා නිර්දේශකර ඇති අතර එස්. එල්. 00 354 ප්‍රභේදය වාරි පෝෂිත තත්ව සඳහා පමණක් නිර්දේශකර ඇත. 2004 දී අභිජනනය කරනලද එස්. එල්. 04 624 උක් ප්‍රභේදය, ඉහළ ගුණාත්මයෙන් යුක්ත හකුරු නිෂ්පාදනය සඳහා නිර්දේශකර ඇත. වර්ෂ 2000න් පසු අභිජනනය කරණලද මතු බලාපොරොත්තු තැබිය හැකි උක් ප්‍රභේද කහිපයක්ම අභිජනන ක්‍රියාවලියේ විවිධ අවධීන්හි ඇත. තේරීමේ ක්‍රියාවලියේ අවසන් අධියරෙහි ඇති ප්‍රභේද, 2002, 2005 සහ 2006 වසරවල අභිජනනය කරනලද ප්‍රභේද වේ. මතු බලාපොරොත්තු තැබිය හැකි උක් ප්‍රභේද කිහිපයක්, එනම්, එස්. එල්. 2002 පෙළපතෙහි ප්‍රභේද 28ක්, 2005 පෙළපතෙහි ප්‍රභේද 25ක් සහ 2006 පෙළපතෙහි ප්‍රභේද 23ක්, ඒවායේ කාර්යසාධනය සඳහා පරීක්ෂාවන්ට ලක්කරමින් පවතින අතර අවම වශයෙන් එක් පෙළපතිකින් සුපිරි ප්‍රභේද 2ක්වත් ඉදිරි වසරවලදී නිර්දේශකර නිදහස් කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ. 1992 දී නිදහස් කරනලද එස්. එල. 83 06 නැමති උක් ප්‍රභේදය වාණිජ වගාවන්හි දී හායනයටලක්වී ඇති අතර, ගුණනය සඳහා සීනි කර්මාන්තායතනවෙත බීජ උක් සැපයීම සඳහා එම ප්‍රභේදයේ ප්‍රතිජනනය කරනලද පැළ 8,000ක් නිෂ්පාදනය කරනලදී. ඊට අමතරව, නැවත ගුණනය කිරීම සඳහා, කලින් නිදහස් කරනලද එස්. එල්. 95 4033 සහ එස්. එල්. 95 4430 උක් ප්‍රභේදවල රෝගවලින් තොර පැළ 3,000ක් ද නිපදවන ලදී. මෙම සුපිරි උක් ප්‍රභේද උක් වගාවන්හි අස්වැනන්න වැඩි කිරීමට මෙන්ම සීනි කම්හල්වල උකහා ගැනීමේ අනුපාතය වැඩි වීමට ද දායකවනු ඇත.

බෝග හා සම්පත් කළමනාකරණය යටතේ උක් වගාවේ වල් මර්දනය සඳහා භාවිතා කළහැකි විකල්ප වල්නාශක සොයාගැනීම පිණිස වෙළඳපොළෙහි පවතින වල්නාශක පරීක්ෂාවන්ට භාජනය කරනලදී. පූර්ව නිර්ගමණ අවස්ථාවේ දී, උක් වගාවේ තෘණ සහ පළල් පත්‍ර වල්පැළ මර්දනය සඳහා ඩයියුරෝන් 46.8% සහ හෙක්සසිනෝන් 13.2% මිශ්‍රණයෙන් කි. ග්‍රෑ. 3-3.5ක් පමණ ජලය ලීටර් 350-400ක මිශ්‍රකර හෙක්ටයාරයකට යෙදීම 2017 වසරේ දී නිරදේශ කරනලදී. මීට අමතරව, හෙක්සසිනෝන් 25% එස්. එල්. සහ අයිසොක්සැෆ්ලුටෝල් 75 ඩබ්ලිව්. ජී. යෙදීම, පූර්ව නිර්ගමණ අවධියේ දී උක් වගාවේ වල් පැළ පාලනය සඳහා යෙදීම ඵලදායී බව සොයාගෙන ඇත. උක් වගාවේ සහ උක් වගාකරන ප්‍රදේශවල ඇති අනෙකුත් තරඟකාරී බෝගවල ආදායම් සහ වියදම් දත්ත යාවත්කාලීන කිරීම ද සිදු කරනලදී.

බෝග පෝෂණ වැඩසටහන යටතේ සිදුකරණ ලද පර්යේෂණ මගින් පාංශු සාරවත්බව කළමනාකරණය සම්බන්ධ නිර්දේශ ලබාදෙන ලදී. සෙවනගල ප්‍රදේශය සඳහා ලබා දී තිබූ පොහොර නිර්දේශය සංශෝධනය කිරීම සඳහා විස්තරාත්මක තොරතුරු ලබාගැනීමට අමතරව, 2017 වසර තුළ දී, අදාල ප්‍රදේශවල පාංශු පෝෂණ තත්වය සැලකිල්ලට ගනිමින්, පැල්වත්ත සී කලාපය සහ හිඟුරාණ දීඝවාපිය කලාපයන්හි පොහොර නිර්දේශ සංශෝධනය කරණලදී. මීට අමතරව, ඉස්කාගාර අපද්‍රව්‍ය ඝන මීටර 40ක්, පෙරහන්මඩ ටොන් 10ක් සමග හෙක්ටයාර 1කට යෙදීමෙන් උක් පැළ වගාවේ කාර්යසාධනය දියුණුවන බවත්, සාන්ද්‍රණය නොකරණ ලද ස්කාගාර අපද්‍රව්‍ය ඝන මීටර 40ක් හෙක්ටයාරයකට යෙදීම මගින් පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩිවීමෙන් උක් වගාකරන පසේ ගුණාත්මය ඉහළයන බවත් ඒ නිසාම පසේ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම්වල සුලබතාවය වැඩිවන බවත් සොයාගන්නා ලදී.

බෝග ආරක්ෂණය යටතේ, උක් සුදු පත්‍ර රෝගය සහ කඳන් විදින පණුවා පාලනය කිරීමට ඉහළම ප්‍රමුඛස්ථානයක් ලබාදුනි. සුදු පත්‍ර රෝගය පාලනය සඳහා, වාහකයන් පාලනය කිරීම සඳහාවන අධ්‍යනයන් අඛණ්ඩව සිදුකරන ලදී. ක්ෂේත්‍රයේ සුදු පත්‍ර රෝග වාහකයා කළමනාකරණය සඳහා ෆිප්රොනිල් කෘමිනාශකය වඩාත් ඵලදායී බව සොයාගන්නා ලදී. රෝග වාහකයා පාලනය සඳහා, බීජ උක් සිටුවීමේ දී ක්ෂේත්‍රයට ෆිප්රොනිල් (පෙනිල් පයිරොසෝල්/ප්‍රින්ස් ජී. ආර්.) හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 18ක් යොදා පසුව මාසිකව ක්ෂේත්‍රයේ මායිමෙහි මීටර් 2ක් පළල තීරුවට බෝගයට මාස 6ක් පමණ වනතෙක් යෙදීම සුදුසුබව නිර්දේශකර ඇත. උක් කඳන් විදින පණුවා පාලනය සඳහා භාවිතාකරණ පෙරොමෝන සඳහා කාර්යක්ෂම සහ ඵලදායී උගුල් සැලැස්ම ලෙස ඩෙල්ටා උගුල හඳුනාගන්නා ලදී. ආයතනය විසින් වාණිජ උක් වගාවන්හි රෝග හා පළිබෝධ තත්වයන් නිරන්තර පරීක්ෂාවට ලක්කොට ඒ සම්බන්ධ තොරතුරු සීනි කර්මාන්තශාලාවල අදාල නිලධාරීන් දැණුවත්කර එමගින් ඔවුන්හට රෝග හා පළිබෝධ තවදුරටත් පැතිරීම වලක්වා ගතහැකිවන පරිදි නියමිත වේලාවට අවශ්‍ය පියවරයන් ගැනීමට පොළඹවන ලදී. තවදුරටත්, රෝග හා පළිබෝධ පාලනය සම්බන්ධ ගොවීනගේ සහ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුම වැඩි දියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට ක්‍රමාණුකූල දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී.

උක් පර්යේෂණ ආයතනයේ සහ සීනි කර්මාන්තායතනවල උණු දිය ප්‍රතිකාර ඒකක ඉදිකිරීම මගින් උක් ගොවිපළ යාන්ත්‍රීකරණ වැඩසටහනද රෝග පාලනය සඳහා දායක විය. උක් පර්යේෂණ ආයතනයේ දැනට පවත්නා උණු දිය ප්‍රතිකාර ඒකකය සඳහා සිසිල් දිය ප්‍රතිකාරය සඳහා පහසුකම්

සැකසීමට අමතරව, උණු දිය සහ සිසිල් දිය පතිකාර පහසුකම්වලින් සමන්විත ප්‍රතිකාර ඒකකයක් කන්තලේ උප මධ්‍යස්ථානයෙහි ඉදිකරන ලදී. ගල්ඔය වැවිලි (පුද්.) සමාගමෙහි උණු දිය ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම පිණිස අවශ්‍ය සේවය උක් පර්යේෂණ ආයතනය විසින් සපයන ලදී. ඊට අමතරව, ආයතනය විසින් ගොවීන් අතර බෙදාහැරීම සඳහා දෙරෝද ට්‍රැක්ටර්වලට සවිකරන තැටි නගුල් 5ක් නිපදවන ලදී.

උක් සහ එහි අතුරු නිෂපාදන සැකසීමෙන් උක් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය සහ උක් හකුරු ප්‍රභේදනය සඳහා, සැකසුම් සහ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. කණිකාමය හකුරු නිපදවීම සඳහා ක්‍රියාවලියක් සංවර්ධනය කරනලදී.

තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන මගින් පර්යේෂණයන්හි සොයාගැනීම්වල භාවිතය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. මෙහිදී, උක් පර්යේෂණ ආයතනය විසින් සංවර්ධනය කරනලද, උක් ප්‍රභේද, ටයින් කල්ටිවේටරය, ඇලි සාදනය සහ ඩිස්ක් මෝල්ඩරය, පරතරයක් ඇතිව සිටුවීම සහ උක් සමග අතුරු බෝග වගාව ප්‍රවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනලදී. ගොවීන්ගේ සහ සීනි කර්මාන්තායතනවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පාංශු සාරවත්බව කළමනාකරණය සහ රෝග සහ පළිබෝධ සම්බන්ධ දැනුම වැඩිකිරීම සඳහාවන වැඩසටහන් ද පවත්වනලදී. තෝරාගත් ගොවීන්ගේ ව්‍යවසායකත්ව කුසළතා වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනලදී. පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 53ක්, ගොවීන් සඳහා ක්ෂේත්‍ර දිනයක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 12ක් පවත්වමින්, ගොවීන් 1,389 දෙනෙකු සහ ක්ෂේත්‍ර නිලධාරීන් 411 දෙනෙකු නව උක් තාක්ෂණයන් සම්බන්ධව පුහුණු කරනලදී. මීට අමතරව, ගොවි ක්ෂේත්‍ර නිරීක්ෂණ 280ක් සිදු කරනලද අතර විශ්වවිද්‍යාල සහ කාර්මික විද්‍යාල සිසුන් 260 දෙනෙකු සහ පාසැල් සිසුන් 140 දෙනෙකු ද උක් තාක්ෂණයන් සම්බන්ධව පුහුණු කරනලදී.

ක්ෂේත්‍ර නිලධාරීන්ගේ, ගොවීන්ගේ සහ අනෙකුත් අදාල පර්ශවයන්ගේ දැනුම ප්‍රවර්ධනය සඳහා පහත දැක්වෙන ක්‍රියාකරකම් සිදු කරනලදී.

i. සීනි කර්මාන්තශාලා ආශ්‍රිතව ක්ෂේත්‍ර ආදර්ශන 80ක් ස්ථාපිතකොට නඩත්තු කිරීම.
ii. නව උක් ප්‍රභේද සම්බන්ධ තොරතුරු පත්‍රිකා 6ක් සහ උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුන (වෙළුම 7 - අංක 1) ප්‍රකාශයට පත්කිරීම.
iii. උපදෙස් පත්‍රිකා 5ක් (උක් පත්‍ර ප්‍රදාහ රෝගය, උක් සුදු පත්‍ර රෝගය, උක් කඳන් විදින පණුවා, උක් නිරි වගා පාලනය සහ උක් සමග අතුරු බෝග වගාව) පිටපත් 5,000ක් නැවත මුද්‍රණය කිරීම සහ සංශෝධිත තොරතුරු පත්‍රිකා 4ක් (උක්වල ගුණාත්මය වැඩි දියුනු කිරීම සහ උක්වගාවේ වල්පැළ කළමනාකරණය) පිටපත් 4,000ක් මුද්‍රණය කිරීම.
iv. ගොවි අත්පොත සහ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම, ගොවිපළ යන්ත්‍රෝපකරණ, රෝග සහා පළිබෝධ සම්බන්ධ උපදෙස් පත්‍රිකා 6,650ක් ගොවීන් සහ සීනි සමාගම්වල ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

v “සාර ප්‍රභා ගිර” ගුවන් විදුලි වැඩසටහන ඔස්සේ උක් පර්යේෂණ ආයතනය සහ එහි ක්‍රියාකාරකම් හා සේවාවන් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම.

සීනි කර්මාන්තය සංවර්ධනය සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරනලදී.

i සීනි සමාගම්වෙත බීජඋක් සැපයීම සඳහා, උඩවලවෙහි හෙක්. 20ක් ද, කන්තලේ හෙක්. 40ක් ද වශයෙන් පදනම් බීජ තවාන් ස්ථාපිතකිරීම හා නඩත්තුකිරීම.

ii උතුරු පළාතේ උක් වගාව ව්‍යාප්තකිරීමට අවශ්‍ය බීජඋක් සැපයීම සඳහා කිලිනොච්චියෙහි හෙක්. 3.5ක බීජඋක් තවාන නඩත්තුකිරීම.

iii බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්යන්හි උක් වගාව ව්‍යාප්ත කිරීමට තවාන් ස්ථාපිත කිරීම සහ දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

iv උතුරු පළාතේ උක් වගාකිරීම, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය කටයුතු සැළසුම් කිරීම.

ආයතනයේ මිනිස්බල අවශ්‍යතාවය ශක්තිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී, පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු 1ක්, පර්යේෂණ නිලධාරී තනතුරු 2ක්, සංවර්ධන නිලධාරී තනතුරු 1ක්, තාක්ෂණ නිලධාරී තනතුරු 2ක් සහ කළමනාකරණ සහකාර (ගිණුම්) තනතුරු 2ක් සඳහා බඳවා ගැනීම් කරනලදී. සුදුසු පුද්ගලයින් නොමැතිකම හේතුවෙන්, ප්‍රධාන පර්යේෂණ නිලධාරී/ප්‍රධාන තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකිවිය. ආයතනයේ පුළුල් කරනලද පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යවන විද්‍යාත්මක/තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය ඉහල නැංවීම පිණිස සේවක සංඛ්‍යා සංශෝධන ක්‍රියාවලිය සිදු කෙරිණි. කාර්යමණ්ඩල ශක්‍යතාව ඉහල නැංවීම යටතේ, ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා මුදාහරින ලද ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ පර්යේෂණ නිලධාරීට අමතරව තවත් පර්යේෂණ නිලධාරියකුහට අවස්ථාව ලබාදෙනලද අතර එක් පර්යේෂණ නිලධාරියකුහට දර්ශනපති උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව ලබාදෙනලදී. අධ්‍යන නිවාඩු ලබා සිටි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියකු සහ පර්යේෂණ නිලධාරියකු නැවත සේවයට වාර්තා කරනලදී. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙකු, පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු, සංවර්ධන නිලධාරීන් දෙදෙනකු, සහකාර අධ්‍යක්ෂ (පාලන), පරිපාලන නිලධාරී, ගිණුම් නිලධාරී, තාක්ෂණ නිලධාරීවරයෙකු, සහ කළමනාකරණ සහකාරවරුන් දෙදනකුහට ආයතනයේ අදාල විෂය ක්ෂේත්‍ර සම්බන්ධ විදේශ පුහුණු අවස්ථා ලබාදෙන ලදී. තවද, ආයතනයේ විවධ සේවා කාණ්ඩවල සේවකයින් සඳහා ඔවුනගේ රැකියාවේ විෂයපථයන්ට අදාලව දේශීය කෙටිකාලීන පුහුණු අවස්ථා ද ලබාදෙන ලදී.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහ කාර්යමණ්ඩලයට හිතකර, වැඩ සහ ජීවත්වීමේ පරිසරයක් සැපයීමට අයහ්‍ය යටිතල පහසුකම් ලබාදීම පිනිස පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

i උඩවලව පර්යේෂණ ආයතනයේ බෝග වැඩිදියුණු කිරීම, බෝග හා සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ, සැකසුම් තාක්ෂණ සහ ජෛව තාක්ෂණ විද්‍යාගාර සහ සම්මන්ත්‍රණ ශාලාව වැඩිදියුණු කිරීම.

ii පාලන අංශය සහ ශ්‍රවනාගාරය සඳහා උඩවලව පැරණි පරිපාලන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සහ ගොවිපළ කාර්යාලය වැඩිදියණු කිරීම.

iii එනසල්වත්ත අභිජනන මධ්‍යස්ථානයෙහි, හන්තාන නිරෝධායන මධ්‍යස්ථානයෙහි සහ සියඹලාණ්ඩුව ව්‍යාධිවේද ගොවිපලෙහි ගොඩනැගිලි ඉදිකිරීම.

iv උඩවලව නිල නිවාස, මාර්ග සහ වාහන නැවතීමේ පහසුකම් වැඩිදියුණු කිරීම.

v උඩවලව ඩී 3 ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.

vi වැදගත් විද්‍යාගාර උපකරණ, නිවාස සහ කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම.

vii උඩවලව ආයතන වැටෙහි කොටසක් පුනරුත්තාපනය කිරීම.

viii කන්තලේ බීජඋක් ගොවිපළෙහි පහසුකම් (උණුදිය ප්‍රතිකාර ඒකකය, කිරන පාලම, වාරි පහසුකම් සහ නිල නිවාස අළුත්වැඩියාව) සංවර්ධනය කිරීම.

ආයතනය විසින් පාසැල්, කාර්මික විද්‍යාල, කෘෂිකර්ම පාසැල් සහ විශ්වවිද්‍යාල සිසුන් පුහුණු සේවා ලබාදෙන ලදී. ඊට අමතරව දේශීය උක් කර්මාන්ත සංවර්ධනයට සම්බන්ධවීම සඳහා ඇල්මැති පාර්ශ්වයන් වෙත අත්‍යාවශ්‍ය තොරතුරු සපයන ලදී.

සහයෝගිතා පර්යේෂණ සිදුකිරීම සඳහා, උක් ජානප්ලාස්ම හුවමාරුව, දැනුම හුවමාරුව සහ කාර්යමණ්ඩල පුහුණුව හා සම්බන්ධයෙන්, චීනයේ යුනාන්හි කෘෂිකාර්ම විද්‍යා ඇකඩමිය සහ එහි උක් පර්යේෂණ ආයතනයන් සමග ගිවිසුම් දෙකකට අත්සන් තැබිණි. පාකිස්ථානයේ ෆයිසිලාබාද් හි උක් පර්යේෂණ ආයතනය සමග සහයෝගීතා කටයුතු ආරම්භ කරනු ලැබීය.

දේශීය උක් කර්මාන්තයේ සංවර්ධනය සඳහා වර්තමාන මෙන්ම අනාගත අවශ්‍යතායන්ට අනුව උක් පර්යේෂණ ආයතනයේ විෂය පථය සහ අධිකාරිය පුළුල් කිරීම පිණිස උක් පර්යේෂණ ආයතනීය පනත සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගැනිණි.

පුහුණු සහ පළපුරුදු මිනිස් බලය හිඟකම සහ නිසි වේලාවට මූල්‍ය පහසුකම් නොමැතිවීම, ආයතනයට නියමිත කාර්යයන් සම්පූර්ණ කිරීමට ප්‍රධාන සීමාකාරී සාධක විය. ආයතනය විසින් සිදු කළ යුතු කාර්යයන් ඉටු කිරීම සඳහා, විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ ශ්‍රේණිවල කාර්යමණ්ඩල බඳවා ගැනීම සහ රඳවා ගැනීමට ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු ය.

ආචාර්ය. ඒ. පී. කීර්තිපාල
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක

# ආංශික වාර්තා



# බෝග වැඩිදියුණු කිරීමේ අංශය

# බෝග වැඩි දියුණු කිරීමේ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය ඒ. විජේසූරිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී) | - | ප්‍රධාන පර්යේෂණ නිලධාරී හා අංශ ප්‍රධානී |
| ඒ. එම්. එම්. එස්. පෙරේරා මිය (විද්‍යාවේදී, විද්‍යාපති) | - | පර්යේෂණ නිලධාරී |
| ආචාර්ය ඩී. මානෙල් (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනශූරී) | - | පර්යේෂණ නිලධාරී |
| කේ. ජී. වික්‍රමසිංහ මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) | - | පර්යේෂණ නිලධාරී |
| ඒ. එල්. සී. කුමාරි මිය | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| ආර්. ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| ඩී. විරසිංහ මහතා | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| එල්. ඩී. ඩී. පී. ගුණරත්න මිය (කෘෂිකර්ම ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| බී. විතාරණ මහතා | - | වැඩ පරිපාලක |
| එච්. එස්. කරුණාරත්න මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |
| ආර්. ජී. එස්. එල්. ප්‍රේමරත්න මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |
| එම්. බී. රොහාන් | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- දේශීයව මුහුම් කිරීමෙන් වැඩි දියුණු කරන ලද එස්. එල්. 00 95, එස්. එල්. 00 534, එස්. එල්. 00 603, එස්. එල්. 00 652 සහ එස්. එල්. 04 624 උක් ප්‍රභේද 05 වාණිජ වගාව සඳහා නිර්දේශ කිරීම. එස්. එල්. 00 95, එස්. එල්. 00 603 සහ එස්. එල්. 00 652 යන උක් ප්‍රභේද, වර්ෂාපෝෂිත සහ වාරිපෝෂිත තත්ව යටතේද, එස්. එල්. 00 354 ප්‍රභේදය වාරිපෝෂිත තත්ව යටතේ ද වගාවට නිර්දේශ කරන ලද අතර එස්. එල්. 04 624 උක් ප්‍රභේදය උක් හකුරු නිෂ්පාදනය සඳහා පමණි.

- ආනයනය කරන ලද උක් ප්‍රභේද 40 ක් (පකිස්තානයෙන් - 34 ඕස්ට්‍රේලියාවෙන් - 6 ) නිරෝධායනයෙන් අනතුරුව උක් නිරෝධායන මධ්‍යස්ථානයෙන් නිදහස් කිරීම සහ ඒවා තව දුරටත් සමීක්ෂණය කිරීම සඳහා උඩවලව පර්යේෂණ ගොවිපල තුළ ගුණනය කිරීම.

- දෙනියාය එනසල්වත්ත උක් අභිජනන උප මධ්‍යස්ථානයේ උක් ජාන දර්ශ 1460ක් ද්වි ප්‍රතිවලිත ලෙස සංරක්ෂණය කිරීම සහ ප්‍රභේද 45ක් අභිජනන බීජ වගාවන්හි නඩත්තු කිරීම. එයට අමතරව පාකිස්ථානයෙන් ආනයනය කරන ලද ප්‍රභේද 57ක් සිසිල් හා උණු දිය ප්‍රතිකාරවලින් පසුව ගුණනය කිරීම.

- ක්ෂේත්‍ර ලැන්තෑරුම් හා දියර මුහුම් ක්‍රම භාවිතයෙන් මුහුම් 1096 ක් කිරීම සහ ඒවායින් සත්‍ය බීජ සැකසීම. මෙම මුහුම්වල සැකරුම් ඔෆිසිනාරුම් හි ගහනය වැඩි දියුණු කිරීම සඳහා වාණිජ මුහුම්, වල් උක් දර්ශ උසස් කිරීම සඳහා වූ මුහුම් හා ගහන වැඩිදියුණු කිරීම සඳහා වූ මුහුම් අඩංගු වේ.

- එස්. එල්. 2013, එස්. එල්. 2012, එස්. එල්. 2011 හා එස්. එල්. 2010 යන අභිජනන පෙළපත්හි වූ යෝග්‍ය ලක්ෂණ සහිත ප්‍රභේද පහත පරිදි අනුයාත වරණ අදියරවල ඇගයීම සඳහා තෝරා ගැනීම.

| පෙළ | | | ප්‍රභේද ගණන |
|---|---|---|---|
| 2013 | වරණ අදියර | I | 1,841 |
| 2012 | වරණ අදියර | I | 2,711 |
| | | II | 661 |
| 2011 | වරණ අදියර | I | 411 |
| 2010 | වරණ අදියර | I | 485 |

- එස්. එල්. 2008 පෙළින් 114 ක් සහ එස්. එල්. 2009 පෙළින් 85ක් ලෙස යෝග්‍ය ලක්ෂණ සහිත උක් ප්‍රභේද 199ක් හඳුනා ගැනීම සහ ඒවා ගුණනය කිරීම.

- එස්. එල්. 2006 පෙළින් 23ක්, එස්. එල්. 2005 පෙළින් 25ක් සහ එස්. එල්. 2002 පෙළින් 28ක් ද ලෙස යෝග්‍ය උක් ප්‍රභේද හඳුනා ගැනීම.

- එස්. එල්. 83 06 උක් ප්‍රභේදය යොදා ගනිමින් ප්‍රතිජනනය කරන ලද උක් පැල 8000ක් පමණ නිපදවීම සහ අළුතින් වාණිජ වගාව සඳහා නිර්දේශ කරන ලද එස්. එල්. 95 4033 හා එස්. එල්. 95 4430 ප්‍රභේදයන් හි රෝගකාරකවලින් තොර බීජ පැල 3,000ක් පමණ බීජ ගුණනය සඳහා නිකුත් කිරීම.

- උක් දර්ශ 600ක් යොදා ගනිමින් ජාන ප්ලාස්ම විවිධත්වය විශ්ලේෂණය කිරීමේ පර්යේෂණය යටතේ, සැකරුම් ස්පොන්ටේනියම් දර්ශ 25ක් සඳහා SSR ප්‍රයිමර්ස් යොදා ගනිමින් කළ අධ්‍යයනය තුලින් ප්‍රවේණික වශයෙන් එකිනෙකට සමාන වූ කාණ්ඩ 6ක් හඳුනා ගැනීම.

## සංවර්ධන කටයුතු

- කන්තලේ හෙක්ටයාර 40ක් හා උඩවලව හෙක්ටයාර 10ක් ලෙස අත්තිවාරම් බීජ උක් තවාන ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම සහ කන්තලේ බීජ උක් තවානෙන් බීජ උක් ටොන් 260ක් ද උඩවලව බීජ උක් තවානෙන් බීජ උක් ටොන් 65ක් ද නිපදවීම.

## අභ්‍යාස ලාභීන් පුහුණු කිරීම

- රුහුණු විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා අධ්‍යයන අංශයේ අවසන් වසර ශිෂ්‍යාවක්වන එච්. වී. ඒ. ෂෙහානි කෝෂිලා මෙනවිය, ඇයගේ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස උක් බෝගය වැඩි දියුණු කිරීමේදී අන්තර් විශේෂ දෙමුහුම් ප්‍රජාව හඳුනා ගැනීම පිළිබඳව කරන ලද අධ්‍යනය අධීක්ෂණය කිරීම.



# බෝග හා සම්පත් කළමනාකරණ අංශය

# බෝග හා සම්පත් කළමනාකරණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| පී. ඒ. ඒ. චතුරංග මහතා (කෘෂි විද්‍යාවේදී) | - | කාර්ය භාර පර්යේෂණ නිලධාරී |
| ඒ. එල්. සී. ද සිල්වා මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) | - | පර්යේෂණ නිලධාරී |
| පී. ආර්. බී. චන්ද්‍රසේන මහතා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | ගොවිපළ අධිකාරී |
| ඩබ්ලිව්. පී. නිමල් මහතා | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| බී. පී. පී. එස්. සන්දනායක මහතා (කෘෂි ඩිප්ලෝමා) | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| අයි. පී. මානවඩු (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී (2017.07.04 සිට) |
| එම්. ශිවපාලන් මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- උක් වගාවේ තෘණ සහ පළල් පත්‍ර වල් මර්දනය සඳහා ඩයුරෝන් 46.8% + හෙක්සාසිනෝන් 13.2% මිශ්‍රණය හෙක්ටයාර 1ක් සඳහා කි. ග්‍රෑ. 3-3.5 ක ප්‍රමානයක් ජලය ලීටර 350-400 ක දියකර වල් පැළ මතුවීමට ප්‍රථම අවස්ථාවේදී යෙදීම සුදුසු බව නිර්දේශ කිරීම.

- හෙක්සාසිනෝන් 25% සහ අයිසොසැන්ලුමෝල් 75 ඩබ්. පී. යන වල් නාශක උක් වගාවේ වල් මර්දනය සඳහා පූර්ව නිර්ගමන වල් නාශක ලෙස යෙදීම ප්‍රතිඵලදායක බව හඳුනා ගැනීම.

- උඩවලව ප්‍රදේශයට අදාලව කෘෂි කාලගුණ දත්ත එකරැස් කිරීම, පරිගණකගත කිරීම හා විශ්ලේෂණය මගින් 2017 වසරෙහි හොඳින් පැතිරුණ මි. මි. 1643.3 ක වාර්ෂික වර්ෂාපතනයක් සහ එහි මාසිකව අවම අගය වන මි.මි. 2.5 ජූලි මාසයේ සහ උපරිමය වන මි.මි. 449.5 නොවැම්බර් මාසයේදී ලැබුන බව හඳුනා ගැනීම.

- සෙවනගල වර්ෂා පෝෂිත ප්‍රදේශයේ ජල සම්පාදන කටයුතු සඳහා ගැලපෙන කාර්යක්ෂමතාවයකින් යුත් ජල පොම්ප හඳුනා ගැනීමට GIS මොඩලයක් නිර්මාණය කිරීම.

## සංවර්ධන කටයුතු

- කිලිනොච්චි හි වන්නේරිකුළම් ප්‍රදේශයේ හෙක්. 3.5ක උක් තවානක් නඩත්තු කිරීම සහ විශ්වමඩු සිවිල් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ගොවිපළෙහි වගා කිරීම සඳහා බීජ උක් ටොන් 10ක් ලබාදීම.

- සිවිල් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව විශ්වමඩු භාරතීපුරම් ගොවිපළෙහි හෙක්. 2ක උක් වගාවක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම.

## සේවාවන්

- සෙවනගල සීනි කර්මාන්තායතනය වෙත උක් ටොන් 218ක් සැපයීම.

- ක්ෂේත්‍රයේ පර්යේෂණ වගාවන් සඳහා හෙක්. 20ක බිම් සැකසීම.

- මූලික බීජ උක් තවාන් සඳහා හෙක්. 3.5ක් සහ ඩී. 5 ප්‍රදේශයේ පර්යේෂණ වගාවන් සඳහා හෙක්. 3.0ක ඉඩම් සංවර්ධනය කිරීම.
- පර්යේෂණ වගාවන්ට ජල සම්පාදනය සඳහා ඩී. 4 ඇළෙහි මීටර 290ක අළුත්වැඩියා කටයුතු කිරීම.

- ආයතන භූමියේ පොල් පැළ 75ක් සහ පළතුරු පැළ 200ක් සිටුවීම.




# බෝග පෝෂණ අංශය

# බෝග පෝෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| බී. ආර්. කුලසේකර මයා (කෘෂි විද්‍යාවේදී) | - | කාර්ය භාර පර්යේෂණ නිලධාරී |
| එච්. ඒ. එස්. වීරසිංහ මයා (විද්‍යාවේදී, විද්‍යාපති. දර්ශනපති) | - | පර්යේෂණ නිලධාරී (2014.02.01 දින සිට අධ්‍යයන නිවාඩු) |
| ආර්. ඒ. සුදර්ශනි මිය (කෘෂි විද්‍යාවේදී) | - | පර්යේෂණ නිලධාරී |
| ජී. එස්. උඩවත්ත මයා | - | තාක්ෂණ නිලධාරී |
| ඩබ්. ඒ. එස්. විජේසූරිය මිය (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| එස්. එම්. ඒ. ඩී. කුමාරි මිය (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී (2017.11.15 සිට) |
| ජේ. ගුණසිරි මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |
| ජී. ඩබ්ලිව්. ඩී. කුලතුංග මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- හිගුරාණ සීනි කර්මාන්තායතනයට අයත් දීඝවාපිය කලාපය සඳහා පොහොර නිර්දේශය යාවත්කාලීන කිරීම.

- සෙවනගල වර්ෂාපෝෂිත උක් වගා ප්‍රදේශයන්හි අව හියුමික් ග්ලේ (Low Humic Glew) පසෙහි හුවමාරු කැල්සියම්, මැග්නීසියම් ප්‍රමානයන්, pH අගය සහ විද්‍යුත් සන්නායකතාව යන පරාමිතීන් වෙසෙසි ලෙස වැඩි අගයක පවතින බව හඳුනාගත් අතර රතු දුඹුරු පසට (Reddish Brown Earth) සාපේක්ෂව හුවමාරු පොටෑසියම් ප්‍රමාණය වෙසෙසි ලෙස අඩු මට්ටමක පවතින බව හඳුනා ගැනීම.

- සෙවනගල වර්ෂාපෝෂිත තත්ව යටතේ උක් වගාකරන ප්‍රදේශයන් හි අව හියුමික් ග්ලේ (Low Humic Glew) පසෙහි මතුපිට කැල්සියම් මැග්නීසියම් හා සෝඩියම් ලවන සාන්ද්‍ර ගතවන බව හඳුනාගැනීම.

- උක් කර්මාන්තයේ අතුරුඵළ වගා බිම් වෙත යොමු කිරීමේදී ස්කාගාර අපද්‍රව්‍ය හෙක්ටයාරයට ඝන මීටර 40ක ප්‍රමාණයක් පෙරහන් මඩ ටොන් 10ක ප්‍රමාණයක් සමග වගාව සිටුවීමට පෙර යෙදීම පැළ වගාවේ වර්ධනයට හිතකර ලෙස බලපාන බව හඳුනාගැනීම.

- හෙක්ටයාරයකට ස්කාගාර අපද්‍රව්‍ය ඝන මීටර 40ක් යෙදීමෙන් උක් වගා කෙරෙන පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ යන අතර ඒ මගින් නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් යන පෝෂක, පසෙහි රඳා පැවැතීම ඉහළ යන බව හඳුනාගැනීම.

- ලංකා සීනි සමාගමේ (සෙවනගල) ඉල්ලීම පරිදි වර්ෂාපෝෂිත ඉඩම් අංක 21 සඳහා උක් වගාවට උචිතබව පිළිබඳව නිර්දේශයන් ලබා දීම.

## සේවාවන්

- උක් දඬු නියැදි 4208ක ගුණාත්මය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදු කිරීම (බෝග වැඩිදියුණු කිරීමේ අංශය සඳහා නියැදි 3012, බෝග සහ සම්පත් කළමණාකරණ අංශය සඳහා නියැදි 1165ක් සහ ලංකා සීනි සමාගම - සෙවනගල සඳහා නියැදි 06)

- සෙවනගල ලංකා සීනි සමාගම මගින් ලැබුනු පස් නියැදි 12ක pH අගය, විද්‍යුත් සන්නායකතාව සහ නයිට්‍රජන් ප්‍රමානය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සහ ගල්ඔය සීනී සමාගමෙන් ලැබුනු පස් නියැදි 05ක පාංශු වයනය පිලිබඳ විශ්ලේෂණ කටයුතු කිරීම.

- කන්තලේ එම්. පී. සීනි සමාගමෙන් ලැබුනු පස් නියැදි 102ක හුවමාරු කැල්සියම් සහ මැග්නීසියම් ප්‍රමාණයන් සඳහා ද, පස් නියැදි  57ක සින්ක් සහ මැංගනීස් ප්‍රමානයන් සඳහා ද, පස් නියැදි 51ක කැට අයන හුවමාරු ධාරිතාවය සඳහා ද විශ්ලේෂණ කටයුතු සම්පූර්ණ කිරීම.

- සැකසුම් තාක්ෂණ අංශයේ පර්යේෂණ වගාවක ක්ෂේත්‍රයේ pH අගය මැනීම සහ පස් නියැදි 50ක පවතින පොස්පරස් ප්‍රමාණය විශ්ලේෂණය කිරීම.

- පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනයට අයත් උක් ගොවිබිම් 05ක පාංශු නියැදී විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.





බෝග ආරක්ෂණ අංශය

# බෝග ආරක්ෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ජී. කේ. ඒ. එස්. එම්. වනසිංහ මිය (විද්‍යාවේදී, විද්‍යාපති) | - | කාර්ය භාර පර්යේෂණ නිලධාරී |
| ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරි මිය (විද්‍යාවේදී ) | - | පර්යේෂණ නිලධාරී (2017.02.01 සිට අධ්‍යයන නිවාඩු) |
| කේ. එම්. ජී. චංචලා මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | පර්යේෂණ නිලධාරී (2017.02.01 සිට අධ්‍යයන නිවාඩු අවසන් වී සේවයට වාර්තාකොට ඇත) |
| වයි. ඒ. පී. කේ. දයාසේන මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | පර්යේෂණ නිලධාරී (2017.07.06 සිට) |
| එම්. කේ. ඩී. උබේසේන මහතා | - | තාක්ෂණ නිලධාරී |
| එල්. එම්. එම්. ඔබේසේන මෙනවිය (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| බී. එන්. එල්. කුමාරනායක මෙනවිය (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| එම්. ආර්. ප්‍රේමලාල් මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |
| ජේ. කේ. යූ. මධුසංඛ මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- උඩවලව උක් පර්යේෂණ ආයතන පර්යේෂණ ගොවිපළ තුළදී සිදුකරන ලද ප්‍රතිවලිත අස්වනු පරීක්ෂාවන්හි ප්‍රතිඵල අනුව 2005 මුහුම් පෙළට අයත් ප්‍රභේද අතුරින් ප්‍රභේද 24ක් කළු දුඹුලු රෝගය සඳහාද, ප්‍රභේද 25ක් සුදු පත්‍ර රෝගය සඳහාද, ප්‍රභේද 23ක් පත්‍ර ප්‍රදාහ රෝගය සඳහාද ප්‍රතිරෝධී බව හඳුනා ගැනීම.

- උක් කළු දුඹුලු රෝගකාරක දිලීරය අණුක ජීව විද්‍යාත්මකව හඳුනාගැනීම සඳහා පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව ඇසුරින් ක්‍රමවේදයක් ගොඩනැගීම.

- රෝග ප්‍රේරණ අධ්‍යන සඳහා යොදා ගත් පැළවල රෝග ලක්ෂණ ඉස්මතුවීම සැලකීමට ගෙන සුදු පත්‍ර රෝග වාහකයාගේ (රෝග කාරක ශරීරය තුළ ඇති) ස්වාභාවික ගහනයෙන් 35% කට රෝගය ප්‍රේරණය කිරීමේ හැකියාව පවතින බව හඳුනා ගැනීම.

- උක් වගා බිම්වල එරිඇන්තස් අරුන්ඩනේසියස් ශාකයේ පේළි 3කින් සමන්විත පර්යන්තයක් සකස් කිරීමෙන් වගා බිම්වලට කෘමි සතුන් ඇතුළු වීමේ සම්භාවිතාව අඩු කළ හැකි බව හඳුනා ගැනීම (පත්‍ර මණ්ඩලය හරහා ආලෝකය ගමන් කිරීමේ තීව්‍රතාවය සැලකීමෙන්).

- වගා බිම් පර්යන්තයේ ෆිප්‍රොනිල් (කෙනිල් පයිරොසෝල්/ප්‍රින්ස් GR) යෙදීම සුදු පත්‍ර රෝග වාහකයාගේ ගහනය අවම කිරීම සඳහා සුදුසු ක්‍රමයක් බව තහවුරු කිරීම. ඒ සඳහා කාර්ය සටහන වන්නේ:මූලික යෙදීම ලෙස හෙක්ටයාර 1කට ෆිප්‍රොනිල් කිලෝග්‍රෑම් 18ක් වශයෙන් මුළු වගාවටම සහ අනතුරුව වගා බිම් පර්යන්තයේ මීටර 2ක් පළල තීරයක පසට මාසයක කාල පරතරයකින් වගාවට මාස 6ක් වන තුරු යෙදීම වේ.

- උක් වගාවේ ප්‍රරෝහ සහ කඳන් විදින පණුවන් මර්දනය සඳහා යොදා ගන්නා පෙරමෝන රැඳවීම සඳහා "ඩෙල්ටා උගුල්" වඩාත් කාර්යක්ෂම බව හඳුනා ගැනීම.

## සේවාවන්

- නිරන්තර ක්ෂේත්‍ර සමීක්ෂණ සිදුකරමින් උක් වගාවේ රෝග සහ පළිබෝධ වසංගත තත්වයන් ඇතිවීම වැළැක්වීම සහ අදාල තත්වයන් පිළිබඳව සීනි කර්මාන්තශාලා දැනුවත් කරීම. ඒ අනුව 2017 වර්ෂය තුළදී පහත සඳහන් නිරීක්ෂණයන් වාර්තා කිරීම.

    - සෙවනගල - උක් පත්‍ර මයිටාවන්ගේ ගහනය අධික වීම

    - පැල්වත්ත - කුකුරම්පොල බීජ උක් තවාන **KP 01** ක්ෂේත්‍රයෙහි සමහර උක් පඳුරුවල පත්‍ර අග්‍රස්ථයේ සිට වියළී යාම සහකුඩා ඔය බීජ උක් තවාන අංක 3/70 ක්ෂේත්‍රයෙහි කහ පැහැති පත්‍ර හා මැද නාරටියේ රතු පැහැති පැල්ලමක් සහිත උක් ශාක පැවතීම. මෙය පර්කින්සිල්ලා සැකරිසිඩා නම් වූ පත්‍ර කීඩෑවාගේ බිත්තර දැමීම නිසා සිදුවන තත්වයක් බව තහවුරු කිරීම (රූප සටහන් 01, 02 සහ 03).



රූප සටහන 01 - කුකුරම්පොල බීජ උක් තවාන ආශ්‍රිතව වාර්තා වූ පත්‍ර කහවීම හා පත්‍ර වියළී යාම සිදුවූ උක් පඳුරක් (2017.04.03)



රූප සටහන 02 - කහ පැහැ වූ පත්‍ර සහ මැද නාරටියේ රතු පැහැති පැල්ලමක් සහිත උක් ශාකයක් (2017.03.23)



රූප සටහන 03 - කුකුරම්පොල බීජ උක් තවාන තුළින් සමණල දැල් හා ආලෝක උගුල් යොදා අල්ලාගත් විවිධ පත්‍ර කීඩෑවන් වර්ග (පර්කින්සිල්ලා සැකරිසිඩා පත්‍ර කීඩෑවා ලකුණුකොට ඇත)

- ඇතිමලේ - උක් කඳන් විදින පණුවාගේ ඉහළ ගහනයක් නිරීක්ෂණය කිරීම.
- හිඟුරාණ - වර්ෂාපෝෂිත කලාපයේ අංක **V 01/01** ක්ෂේත්‍රය තුළ උක් වුල් කුඩිත්තාගේ ඉහළ ගහනයක් වාර්තා වීම.

  බීජ උක් තවාන තුළ 0-0.96% ක ප්‍රමානයකින් කළු දුඹුලු රෝගය සහ 1.85%ක් දක්වා ප්‍රමාණයකින් සුදු පත්‍ර රෝගය වාර්තා වීම.
- කන්තලේ - 2017 ජනවාරි මාසයේදී ආමි පණුවන්ගේ ගහනය වැඩි වීම.

  2017 පළමු සහ දෙවන කාර්තුවල දී පයිරිල්ලා පත්‍ර කීඩෑවාග් ගහනය ඉහල යාම.

  එපිරිකානියා මෙලෙනොලියුකා නම් වූ පරපෝෂිතයා සාර්ථක ලෙස බීජ තවාන තුළ ස්ථාපිත කිරීම (අහඹු ලෙස තෝරාගත් උක් පඳුරු120ක් තුළ බිත්තර 163ක් ද, කීටයින් 255ක් ද, කෝෂ 754ක් ද, සුහුඹුලන් 24ක් ද වාර්තා විය).
- පාකිස්තානයේ කෘමීන් හඳුනා ගැනීමේ **CABI** සේවාව යටතේ, දැනට හඳුනාගෙන නොතිබූ උක් ප්‍රරෝහ සහ කඳන් විදින පණුවන් විශේෂ 3ක් හඳුනා ගැනීම (රූප සටහන අංක 04)



රූප සටහන අංක 04- ඩයිමීර්යා සැකරාලිස් පලිබෝධකයාගේ සුහුඹුල් සතෙක්



සර්පොජේගා නිවෙල්ලා පලිපෝධකයාගේ සුහුඹුල් සතෙක්

- ගල්ඔය වැවිළි සමාගමට අයත් ගල්මඩුව උක් ක්ෂේත්‍රයක් සඳහා උක් ප්‍රරෝහ හා කඳන් විදින පණුවන්ගේ ස්වාභාවික පරපෝෂිතයකුවන කොටේෂියා ෆ්ලැවිපස් ගේ කෝෂ 590ක් ද, සුහුඹුළන් 69ක් ද නිදහස් කිරීම. මෙම පරපෝෂිතයා හානි කරනු ලැබූ එක් කීටයකු 2017.03.15 දින සොයා ගැනීම.

## අභ්‍යාසලාභීන් පුහුණු කිරීම්

- ජාතික ආධුනිකත්ව සහ පුහුණු කිරීමේ අධිකාරියට අනුබද්ධ එම්. බී. එම. හතරසිංහ ශිෂ්‍යාවට 2017.02.15 දින සිට 2017. 11. 14 දින දක්වා උක් පළිබෝධ පාලන වැඩසටහන යටතේ පුහුණුවක් ලබාදීම.




# යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

# යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| කේ. එච්. ඩී. අබේරත්න මහතා (කෘෂි විද්‍යාවේදී) | - | කාර්යභාර පර්යේෂණ නිලධාරී |
| කේ. ටී. ආරියවංශ මහතා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | පර්යේෂණ නිලධාරී (2016.06.04 සිට අධ්‍යයන නිවාඩු) |
| ඒ. එස්. එම්. ඒ. ප්‍රනාන්දු මහතා (තාක්ෂණික ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| ඩබ්. එම්. අනුරපාල මහතා | - | තාක්ෂණ නිලධාරී |
| වී. අබේගුණවර්ධන මහතා | - | පෑස්සුම්කරු |
| පී. ආරියරත්න මහතා | - | වෑද්දුම්කරු |
| ඩබ්. ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා | - | කම්මල්කරු |
| ඩී. එම්. එල්. වීරසිරි මහතා | - | කාර්මික |
| ඩී. එම්. වීරසිරි මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- ගල්ඔය වැව්ලි පුද්ගලික සමාගම සඳහා උණු දිය ප්‍රතිකාර ඒකකයක් නිර්මාණය කිරීම සහ එහි නිමැවුම් හා ඉදිකිරීම් කටයුතු සඳහා උපදෙස් ලබා දීම.

- කන්තලේ උප මධ්‍යස්ථානයේ සිසිල් දිය ගිල්ලුම් හා උණු දිය ප්‍රතිකාර ඒකකයන්ගේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.

- උඩවලව උණු දිය ප්‍රතිකාර ඒකකයට යාකොට ලීටර් 32000ක ධාරිතාවයෙන් යුත් සිසිල් දිය ගිල්ලුම් ප්‍රතිකාර ඒකකයක් ඉදි කිරීම.

- උක් ගොවීන් අතර බෙදාදීම පිණිස දෙරෝද ට්‍රැක්ටරයට සවිකළ හැකි පස මුදුන් කිරීමේ තැටි උපකරණ (Disc Moulder) භාවිතා කරණ ඩිස්ක් මෝල්ඩර් 5ක් නිපදවීම.

- පේලි අතර වල් මර්දනය සඳහා කුඩා කල්ටිවේටරයක් හා විශේෂිත වල් කපන යන්ත්‍රයක් මිලදී ගැනීම

- උඩවලව පර්යේෂණ ගොවිපලේ සියළුම විදුලි වැටවල් සඳහා පැරණි බැටරි ආරෝපණ පද්ධති ඉවත්කර, ඒ වෙනුවට සූර්ය බල ශක්තිය උපයෝගී කරගනිමින් ආරෝපණය වන ආරෝපිත ඒකකයන් ස්ථාපිත කිරීම.

- විශ්වමඩු ගොවිපලේ උක් වගාව වල් වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා කිලෝමීටර් 2.5ක දිගින් යුත් විදුලි වැටක් ස්ථාපිත කිරීම.

### සේවාවන්

- උක් පර්යේෂණ ආයතනයේ ප්‍රධාන පිවිසුම් මාර්ගයේ දෙපස මීටර් 1500ක දිගින් යුත් ආරක්ෂිත දැල් වැට ඉදි කර අවට භූ දර්ශනය අලංකාරවත් කිරීම.

- මුදුන් විවෘත ක්ෂේත්‍ර කුටි 12ක් සඳහා පොලිතීන් ආවරණ සවිකිරීම.

- උක් පර්යේෂණ ආයතනයේ වර්ග අඩි 1500ක පොලිතීන් ගෘහය ප්‍රතිසංස්කරණය කිරීම.

- යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශ පරිශ්‍රයේ කැටගල් ඇතිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම.

- උඩවලව උක් පර්යේෂණ ආයතනයේ වාහන නැවතුම් ගාල වර්ග අඩි 4000ක ප්‍රමාණයකින් පුළුල් කිරීම.

- උඩවලව පර්යේෂණ ගොවිපලේ ට්‍රැක්ටර් නැවතුම් ගාල වර්ග අඩි 2400ක ප්‍රමාණයකින් පුළුල් කිරීම.

- උඩවලව පර්යේෂණ ගොවිපලේ විදුලි වැට ඉදිකර ඇති ප්‍රදේශ සඳහා අඩි **3x15** ප්‍රමාණයේ ගැල්වනයිස් දැල් ගේට්ටු 04ක් සාදා සවිකිරීම.

- උඩවලව නිල නිවාස සංකීර්ණ 02 හා 03 හි ප්‍රධාන මාර්ගයෙන් ඇති පිවිසුම් සඳහා අඩි 5x15 ප්‍රමාණයේ ප්‍රධාන ගේට්ටු 02ක් සාදා සවිකිරීම.

- උඩවලව උක් පර්යේෂණ ආයතනයේ මායිම් වැට මීටර් 5000ක් දිගට නව කටු කම්බි යොදා ප්‍රතිසංස්කරණය කිරීම.

- හන්තාන ශාක නිරෝධායන මධ්‍යස්ථානය සඳහා වර්ග අඩි 1750ක පොලිතීන් ගෘහයක් නිර්මාණය කර එහි ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම.

- කිළිනොච්චියේ  කන්ටේනර් නිවහන සඳහා අඩි **16x20** ප්‍රමාණයේ අමානෝ වහලයක් නිර්මාණය කර ඉදිකිරීම.

- පර්යේෂණ සඳහා අවශ්‍ය යාන්ත්‍රික සේවාවන් සැපයීම.

- උක් පර්යේෂණ ආයතනයේ වාහන හා ගොවිපල උපකරණ සේවා කිරීම්, නඩත්තු හා අළුත්වැඩියා කටයුතු කිරීම.





# සැකසුම් තාක්ෂණ අංශය

# සැකසුම් තාක්ෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| එස්. එම්. ටී. ඒ. මාරලන්ද මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | කාර්ය භාර පර්යේෂණ නිලධාරී |
| ආචාර්ය ඩබ්. එල්. අයි. විජේසේකර (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී) | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (2017.01.02 සිට 2017.05.22 දක්වා) |
| එම්. පී. පී. එන්. සෙව්වන්දි (ඉංජිනේරු විද්‍යාවේදී) | - | පර්යේෂණ නිලධාරී (2017.12.04 සිට) |
| එම්. ඒ. ආර්. අයි. පෙරේරා මෙනවිය (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| ඩබ්ලිව්. කේ. ඩී. එස්. කරුණාරත්න මයා (කෘෂි ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරී |

## විශේෂ ජයග්‍රහණයන්

### පර්යේෂණ

- උක් රොඩු එකතුකරන ලද බිස්කට් නිෂ්පාදනය කිරීම සඳහා වට්ටෝරුවක් වැඩි දියුණු කිරීම සහ එම නිෂ්පාදනයේ ජෛව රසායනික දත්ත විශ්ලේෂණය කිරීම. සංවේදීතාවය ඇගයීමේ පරීක්ෂණ දත්ත අනුව, පොත්ත ඉවත් කරන ලද උක් ගසෙන් ලබාගත් උක් රොඩු 5%ක් එකතු කළ බිස්කට් නිෂ්පාදනයේ සමස්ථ පිලිගත හැකි බව පොත්ත ඉවත් නොකරන ලද උක් රොඩු 5%ක් එකතු කළ බිස්කට් නිෂ්පාදනයට සහ පොත්ත ඉවත් කළ උක් රොඩු 10% එකතු කළ බිස්කට් නිෂ්පාදනයට වඩා වැඩි බව සොයා ගැනීම.

- කණිකාමය උක් හකුරු නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රියාවලියක් වැඩි දියුණු කිරීම සහ එම කණිකාමය හකුරුවල ජෛව රසායනික දත්ත විශ්ලේෂණය කිරීම.

- නෙරවුම් ක්‍රියාවලිය මගින් උක් රොඩු එකතු කරන ලද සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදනයක් වැඩි දියුණු කිරීම.

### සේවාවන්

- සබරගමුව සහ වයඹ යන විශ්වවිද්‍යාලවල සිසුන් සඳහා උක් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව පුහුණු වැඩ සටහන් සිදු කිරීම.

- වැල්ලවාය ප්‍රදේශයෙන් පැමිණ ආයෝජකයන් සඳහා කණිකතාවය උක් හකුරු නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබාදීම.

- බෝග ආරක්ෂණ අංශයේ පර්යේෂණ කටයුතු සඳහා කෘතිම පළිබෝධ ආහාරයක් නිෂ්පාදනය කිරීම.

- එස්. එල්. 04 624 උක් ප්‍රභේදය වාණිජ වගාවක් ලෙස නිකුත් කිරීමේ කටයුතුවලට එම ප්‍රභේදයෙන් උක් හකුරු නිෂ්පාදනය කිරීම.

- උක් වගාව සඳහා ජෛව පටල ජෛව පොහොරවල සපලත්වය ඇගයීම සඳහා බෝග පෝෂණ අංශය විසින් සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර පිරික්සුම් පරීක්ෂණයේ පස් නියැදිවල ක්ෂුද්‍ර ජීවී ගහණය පරීක්ෂා කිරීම.

- ක්ෂේත්‍ර අත්හදා බැලීම් සඳහා භාවිතා කළ උක් යොදා ගනිමින් උක් හකුරු කිලෝග්‍රෑම් 2,938ක් නිෂ්පාදනය කිරීම

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් විසින් සිදු කරන ලද පහත සඳහන් ව්‍යාපෘති දෙක අධීක්ෂණය කිරීම.
    - උක් රොඩු ආශ්‍රිත තන්තු එකතු කරන ලද බිස්කට් නිෂ්පාදනයේ භෞතික-රසායනික ලක්ෂණ විශ්ලේෂණය - එම්. පී. පී. විජේරත්න
    - පොත්ත ඉවත් කරන ලද හා ඉවත් නොකරන ලද උක් භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද කණිකාමය උක් හකුරුවල ජෛව රසායනික දත්ත සංසන්දනාත්මක විශ්ලේෂණය - ඩබ්. කේ. ඩී. සුවිමල්



# ආර්ථික විද්‍යා, ජෛවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

# ආර්ථික විද්‍යා, ජෛවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මහතා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී |
| බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති) | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (2015.02.20 දින සිට අධ්‍යයන නිවාඩු) |
| කේ. පී. එස්. යු. ආර්. බණ්ඩාර (HNDIT, CCNA) | - | තාක්ෂණ නිලධාරී |

## විශේෂ ජයග්‍රහනයන්

### පර්යේෂණ

- උක් වගාවේ පිරිවැය හා ආදායම් දත්ත 2017 වර්ෂයේ මිළ ගණන් අනුව යාවත්කාලීන කිරීම. ඒ අනුව හෙක්ටයාරයක උක් වගාවක් සඳහා සාමාන්‍ය වාර්ෂික පිරිවැය සෙවනගල වාරිපෝෂිත, සෙවනගල වාර්ෂාපෝෂිත, පැල්වත්ත හා හිඟුරාණ යන ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු.280,721, රු.237,164, රු.174,781 හා රු.249,245 ක් විය. උක් වගාවේ හෙක්ටයාරයක සාමාන්‍ය ශුද්ධ වාර්ෂික ආදායම සෙවනගල වාරිපෝෂිත හා වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු. 165,528 හා රු. 119,086 ක් විය. වර්ෂා පෝෂිත තත්ව යටතේ පැල්වත්ත ප්‍රදේශයේ වාර්ෂිත ශුද්ධ ආදායම හෙක්ටයාර එකකට රු. 85, 219 ක් හා වාරිපෝෂිත තත්ව යටතේ හිඟුරාණ ප්‍රදේශයේ එය රු. හෙක්ටයාරයට රු. 100,755 ක් විය.

- වර්ෂා පෝෂිත තත්ව යටතේ පැල්වත්ත ප්‍රදේශයේ උක් වගාවේ තරඟකාරී බෝගවන බඩඉරිඟු, කව්පි, උඳු, වට්ටක්කා, හා කොමඩුවල කන්නයක දී ලැබෙන ශුද්ධ ආදායම පිළිවෙලින් රු. 36,990, රු. 30,250, රු 29,650, රු.47,750 හා රු. 59,450 ලෙස ඇස්තමේන්තු කිරීම.

- වාරිපෝෂිත තත්ව යටතේ සෙවනගල ප්‍රදේශයේ උක් වගාවේ තරාගකාරී බෝග වන කෙසෙල් (ඇඹුල්), කෙසෙල් (කෝලිකුට්ටු) හා වී සඳහා වසරකදී ලැබෙන සාමාන්‍ය ශුද්ධ ආදායම පිළවෙලින් රු. 351,860ක්, රු. 334,407ක් හා රු. 177,730ක් ලෙස ඇස්තමේන්තු කිරීම.

- වර්ෂ 2016 ට අදාලව සෙවනගල හා පැල්වත්ත සීනි සමාගම්වල උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු 15,714ක් හා රු. 15,440ක් විය. ඒ අනුව සෙවනගල වාරිපෝෂිත කලාපයේ හා පැල්වත්ත වර්ෂාපෝෂිත කලාපයේ හෙක්ටයාරයකින් නිපදවන උක්වල සම්පූර්ණ වාණිජ වටිනාකම පිළිවෙලින් රු. මිළියන 1.4ක් හා මිළියන 0.8ක් වු අතර එය අනෙකුත් තරඟකාරී බෝගවලට සාපේක්ෂව ඉතා ඉහල අගයක් ගන්නා බව සොයා ගැනීම.

- සියඹලාණ්ඩුව ප්‍රදේශයේ උක් පැණි නිෂ්පාදනයෙන් එක් උක් පැණි නිෂ්පාදන ඒකකයකින් 2017 වර්ශය තුලදී ආසන්න වශයෙන් රු. 0.99 ක ලාභයක් ලබා ගත හැකි බව ඇස්තමේන්තු ගත කිරීම.

### සේවාවන්

- උක් පර්යේෂණ ආයතනයේ www.sugarres.lk වෙබ් අඩවිය ප්‍රති නිර්මාණය කරන ලද අතර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම.
- ආයතනයේ "Sugarcane Sri Lanka" සඟරාවේ තෙවන කලාපය නිකුත් කිරීම.
- ආයතනයේ අනෙකුත් අංශ වෙත පහත සේවාවන් සැපයීම.
    - බෝග වැඩිදියුණු කිරීමේ අංශය, බෝග පෝෂණ අංශය හා සැකසුම් තාක්ෂණ අංශය යන අංශවල පර්යේෂණ සඳහා සැලසුම් නිර්මාණය කිරීම.
    - උක් පර්යේෂණ ආයතනය තුළ තොරතුරු තාක්ෂණයට අදාල කටයුතු කිරීම.

- උක් පර්යේෂණ ආයතනයේ 2016 වර්ෂයට අදාල **INFORM** දත්ත ගබඩාව සැකසීම හා එය ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව වෙත ලබාදීම.

- ජාතික වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ සිසුන් පස් දෙනෙකුට මාස 06 ක පරිඝණක මෘදුකාංග භාවිතය පිළිබඳව පුහුණුවක් ලබා දීම.





# තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය

# තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය එම්. එස්. පෙරේරා<br>(කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි) | - | ප්‍රධාන පර්යේෂණ<br>නිලධාරී හා අංශ ප්‍රධානී |
| ඩී. ජී. ඩබ්ලිව්. පොත්තවෙල මයා<br>(කෘෂි විද්‍යාවේදී, පශ්චාත් උපාධි ඩිප්ලෝමා) | - | තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී |
| ආර්. ඒ. පී. ඒ. රණතුංග මයා (කෘෂි ඩිප්ලෝමා) | - | සංවර්ධන නිලධාරී |
| එස්. එන්. වික්‍රමසිංහ මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | සංවර්ධන නිලධාරී |
| ඩබ්ලිව්. ජී. එම්. එස්. වේරගොඩ මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති) | - | සංවර්ධන නිලධාරී |
| එම්. කේ. පී. සී. ගුණවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී) | - | සංවර්ධන නිලධාරී |
| ඒ. පී. කරුණාතිලක මයා (කෘෂි විද්‍යාවේදී) | - | සංවර්ධන නිලධාරී |
| ඒ. පී. ජේ. මොහොට්ටි මයා | - | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී |
| ජී. සෝමවීර මයා | - | කළමනාකරණ සහකාර |

## විශේෂ ජයග්‍රහණයන්

## තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්

- උක් වගා කරුවන් සඳහා පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 53ක්, ක්ෂේත්‍ර දින1ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 12ක් ක්‍රියාත්මක කරමින් ගොවීන් 1389 දෙනෙකු සහ කේෂ්ත්‍ර නිලධාරීන් 411 දෙනෙකු, නව උක් වගා තාක්ෂණයන් සම්බන්ධව පුහුණු කිරීම. ගොවි ක්ෂේත්‍ර නිරීක්ෂණ 280ක් සිදු කරන ලද අතර විශ්ව විද්‍යාල සහ කාර්මික විද්‍යාල සිසුන් 260ක් ද පාසැල් 133 දෙනෙකුද, උක් වගා තාක්ෂණයන් සම්බන්ධව පුහුණු කිරීම.

- සීනි කර්මාන්තශාලා ආශ්‍රිතව ක්ෂේත්‍ර ආදර්ශන 80ක් ස්ථාපිතකොට පවත්වාගෙන යාම.

- නව උක් ප්‍රභේද සම්බන්ධ තොරතුරු පත්‍රිකා 6ක් සහ උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුන (වෙළුම 7 අංක 1) කලාපය ප්‍රකාශයට පත් කිරීම.

- උක් පත්‍ර ප්‍රදාහ රෝගය, සුදු පත්‍ර රෝගය, උක් ප්‍රරෝහ විදින පණුවා, උක් නිරි වගා පාලනය සහ උක් සමග අතුරු බෝග වගා කිරීම යන උපදෙස් පත්‍රිකාවල පිටපත් 5,500ක් නැවත මුද්‍රණය කිරීම, සහ සංස්කරණය කරන ලද උක්වල ගුණාත්මය ඉහල නැංවීම සහ උක් වගාවේ වල් මර්දනය යන තොරතුරු පත්‍රිකා පිටපත් 4,000ක් මුද්‍රණය කිරීම.

- ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරකම්, ගොවිපළ යන්ත්‍රෝපකරණ, රෝග සහ පළිබෝධ සම්බන්ධ උපදෙස් පත්‍රිකා සහ උක් වගා ගොවි අත්පොතෙහි පිටපත් 6,550ක් පමණ සීනි කර්මාන්තශාලා ආශ්‍රිත ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

- "සාර ප්‍රභා ගිර" ගුවන් විදුලි වැඩසටහන් මාලාවෙහි උක් කර්මාන්තයට අදාල වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

- උක් ගුණාත්මය දියුණු කිරීම, නිරි වගා කළමනාකරණය, රෝපණ ක්‍රම, අතුරු බෝග වගා කිරීම සහ කුඩා පරිමාණ ගොවිපළ යන්ත්‍රෝපකරණ යන ක්ෂේත්‍රයන්ට අදාලව උපදේශාත්මක වීඩියෝපට නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ වීඩියෝගත කිරීම.

- උක් ගුණාත්මය ඉහල නැංවීම, වල් මර්දනය (සංශෝධිත) සහ තවාන් පාලනය සම්බන්ධ තොරතුරු පත්‍රිකා මුද්‍රණය සඳහා කෙටුම්පත් කිරීම.

ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ සිසුන් සඳහා පුහුණු වැඩසටහන් සහ ක්ෂේත්‍ර ආදර්ශන ක්‍රියාත්මක කිරීමේ දී, පහත දැක්වෙන කරුණු සහ විෂයපථයන්ට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

- **උක් පර්යේෂණ ආයතනය විසින් නිපදවන ලද උක් ප්‍රභේදවන, එස්. එල්. 83 06, එස්. එල්. අයි. 121, එස්. එල්. 89 1673, එස්. එස්. එල්. 92 4918, එස්. එල්. 92 4997, එස්. එල්. 92 5588, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4430, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4443, එස්. එල්. 96 128, එස්. එල්. 96 328 සහ එස්. එල්. 98 2524 උක් වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම**

    - එස්. එල්. 83 06, එස්. එල්. 92 4918, එස්. එල්. 96 128, එස්. එල්. 96 328 සහ එස්. එල්. 98 2524 ප්‍රභේදවල ක්ෂේත්‍ර ආදර්ශන/ගුණන ක්ෂේත්‍ර 5ක් (හෙක්. 2.2ක්) සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාන ප්‍රදේශවල ස්ථාපිත කිරීම

    - ගොවීන් 576 දෙනෙකු සඳහා නව උක් ප්‍රභේද සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 3ක් සහ පුහුණු සැසි 16ක් පැල්වත්ත, සියඹලාණ්ඩුව හා හිඟුරාණ ප්‍රදේශයන්හි දී පැවැත්වීම.

    - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ බඩල්කුඹුර ප්‍රදේශයන්හි, සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් ඇතුළුව ක්ෂේත්‍ර නිලධාරීන් 180 දෙනෙකු සඳහා පුහුණු සැසි 09ක් පැවැත්වීම.

    - සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන 5ක් අධීක්ෂණය කිරීම.

    - බුත්තල, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර නිරීක්ෂණ 60ක් පැවැත්වීම.

    - එස්. එල්. 98 2524, එස්. එල්. 00 95, එස්. එල්. 00 354, එස්. එල්. 00 603, එස්. එල්. 00 652 සහ එස. එල්. 00 624 යන නව උක් ප්‍රභේදයන්ට සම්බන්ධව තොරතුරු පත්‍රිකා 500 බැගින් මුද්‍රණයකොට ප්‍රකාශයට පත් කිරීම.

    - හිඟුරාණ ප්‍රදේශයේ ස්ථාපිතකොට ඇති නව උක් ප්‍රභේදවල ක්ෂේත්‍ර ආදර්ශනවල අස්වැන්න නෙළීමෙන් ගත් උක් ටොන් 150ක් ගොවීන්ගේ ක්ෂේත්‍රවල ගුණනය සඳහා සිටුවීම.

- **ටයින් කල්ටිවේටරය (TYNE CULTIVATOR), ඇලි සාදනය (FURROW OPENER) සහ පස මුදුන් කිරීමේ උපකරණය (DISC MOULDER) උක් වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම**

    - සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවල ගොවීන් 117 දෙනෙකු සහ නිලධාරීන් 18 දෙනෙකු සඳහා ටයින්කල්ටිවේටරය සහ ඇලි සාදනය සම්බන්ධ පුහුණු සැසි 15ක් පැවැත්වීම.

    - සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ගොවීන් සඳහා උක් වගාවේ වල් මර්දනය සහ පස මුදුන් කිරීමේ දී යන්ත්‍ර භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම.

    - පැල්වත්ත සීනි කර්මාන්තායතන ක්ෂේත්‍ර කාර්යාලවල ටයින් කලටිවේටර ප්‍රදර්ශනයට තැබීම.

    - ගොවිපල යන්ත්‍රෝපකරණ පිළිබඳ උපදෙස් පත්‍රිකා 1,000ක් නැවත මුද්‍රණය කිරීම සහ එවායින් පිටපත් 600ක් ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

    - ගොවිපල යන්ත්‍රෝපකරණ පිළිබඳ උපදේශාත්මක වීඩියෝපටයක් නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ විඩියෝගත කිරීම් සිදු කිරීම.

- **උක් වගාව සමග අතුරු බෝග (පිපිඤ්ඤා, රටකජු, කව්පි, පැණි කොමඩු සහ මිරිස්) වගාව ප්‍රචලිත කිරීම**

    - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවල, රටකජු සහ කව්පි අතුරු භෝග ලෙස වගා කරන ලද ක්ෂේත්‍ර ආදර්ශන 59ක් ස්ථාපිතකොට පවත්වා ගෙනයාම.

- සෙවනගල, පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවල ගොවීන් 751 දෙනෙකු සඳහා අතුරු බෝග වගාව සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 11ක් සහ පුහුණු සැසි 23ක් පැවැත්වීම.

- ක්ෂේත්‍ර නිලධාරීන් 235 දෙනෙකු සඳහා පුහුණු සැසි 08ක් පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවලදී පැවැත්වීම.

- ගොවීන් 20 දෙනෙකු සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් බුත්තල ප්‍රදේශයේදී පැවැත්වීම.

- ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාපිත කිරීම සඳහා, රටකජු බීජ කිලෝග්‍රෑම් 300ක්, මුං බීජ කිලෝග්‍රෑම් 23ක් කව්පි බීජ කිලෝග්‍රෑම් 7.7ක් සහ පැණි කොමඩු, තල, උඳු බීජ සුළු ප්‍රමානයන්ගෙන් ගොවීන්හට සැපයීම.

- උක් සමග අතුරු බෝග වගාකිරීම (සංශෝධිත) උපදෙස් පත්‍රිකා 2,000ක් මුද්‍රණය කිරීම.

- උක් සමග අතුරු බෝග වගාකිරීම පිළිබඳ උපදෙස් පත්‍රකා 1,100ක් ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදාහැරීම.

- උක් සමග අතුරු බෝග වගාකිරීම පිළිබඳ උපදේශාත්මක වීඩියෝපටයක් නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ වීඩියෝගත කිරීම් සිදු කිරීම.

- **පසේ සාරවත් බව කළමනාකරණය සඳහා ගොවීන් පෙළඹවීම**

  - පසේ සාරවත් බව ඉහල නැංවීම සඳහා ක්ෂේත්‍ර ආදර්ශන 17ක් (හෙක්. 1 බැගින්) පැල්වත්ත ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශයේ ගොවීන් 354 දෙනෙකු සඳහා පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් 19ක් පැවැත්වීම.

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව හා හිඟුරාන ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් 129 දෙනෙකු සඳහා, පසේ සාරවත් බව කළමනාකරණය පිළිබඳ පුහුණු සැසි 07ක් පැවැත්වීම.

  - සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය සීනි කර්මාන්තායතනයන්ට අනුබද්ද ක්ෂේත්‍ර නිලධාරීන් 54 දෙනෙකු සඳහා ජල පරිභෝජන කාර්යක්ෂමතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් 2ක් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්වීම.

  - හිඟුරාන ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍ර 20ක පොහොර යෙදීම සහ පසේ සාරවත් බව කළමනාකරණය සම්බන්ධ ක්ෂේත්‍ර නිරීක්ෂණ 65ක් සිදු කිරීම.

- **පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය (SPACED PLANTING TECHNIQUE) ප්‍රචලිත කිරීම**

  - හිඟුරාන ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන 2ක් ස්ථාපිත කිරීම.

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශයේ ගොවීන් 485 දෙනෙකු සඳහා සිටුවීමේ ක්‍රමවේද සම්බන්ධ පුහුණු සැසි19ක් පැවැත්වීම.

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිලධාරීන් 176 දෙනෙකු සඳහා ගොවීන් වෙනුවෙන් සිටුවීමේ ක්‍රමවේද සම්බන්ධ පුහුණු සැසි11ක් පැවැත්වීම.

  - සිටුවීමේ ක්‍රමවේද පිළිබඳ උපදේශාත්මක වීඩියෝපටයක් නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ වීඩියෝගත කිරීම් සිදු කිරීම.

- **ගොවීන්ගේ දැනුම සහ හොඳම කළමනාකරණ ක්‍රම අනුගමනය ඉහළ නංවා උක් අස්වැන්නේ ගුණාත්මය වැඩි දියුණු කිරීම**

  - සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ගොවීන් 433 දෙනෙකු සඳහා හොඳම කළමනාකරණ ක්‍රම අනුගමනයකොට උක් අස්වැන්නේ ගුණාත්මය වැඩි දියුණු කිරීම පිළිබඳ පුහුණු සැසි 22ක් පැවැත්වීම.

  - පැල්වත්ත, සියඹළාණ්ඩුව හා බඩල්කුඹුර ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් 235 දෙනෙකු සඳහා පුහුණු සැසි 11ක් පැවැත්වීම.

  - සෙවනගල ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 3ක් පැවැත්වීම.

  - උක්වල ගුණාත්මය ඉහල නැංවීම පිළිබඳ උපදේශාත්මක වීඩියෝපටයක් නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ විඩියෝගත කිරීම් සිදු කිරීම.

  - උක්වල ගුණාත්මය ඉහල නැංවීම පිලිබඳ තොරතුරු පත්‍රිකාවක් සැකසීමට කෙටුම්පත් කිරීම.

- **උක් වගාවේ නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතය වැඩි කිරීම**

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශයන්හි ගොවීන් 708 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන්/ආදර්ශන 27ක් පැවැත්වීම.

  - නිරි වගා කළමනාකර්ණය සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශනයක් හිඟුරාන ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.

  - පැල්වත්ත, සියඹළාණ්ඩුව හා බඩල්කුඹුර ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් 235 දෙනෙකු සඳහා පුහුණු සැසි 11ක් පැවැත්වීම.

  - නිරි වගා කළමනාකරණය පිළිබඳ උපදේශාත්මක වීඩියෝපටයක් නිපදවීම සඳහා පිටපත් සැකසීම සහ විඩියෝගත කිරීම් සිදු කිරීම.

  - නිරි වගා කළමනාකරණය (සංශෝධිත) පිළිබඳ උපදෙස් පත්‍රිකා 2000ක් මුද්‍රණය කිරීම.

  - උක් වගා අත්පොත් 850ක්, වල් මර්දනය සහ නිරි වගා පාලනය පිළිබඳ උපදෙස් පත්‍රිකා 1600ක් සහ පුවත් හසුන පිටපත් 500ක් ගොවීන් සහ නිලධාරීන් අතර බෙදා දීම.

  - හිඟුරාන සහ සියඹලාණ්ඩුව ප්‍රදේශයන්හි ගොවීන් 105 දෙනෙකු සඳහා වගා කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍ර නිරීක්ෂණ 105ක් පැවැත්වීම.

- **උක් වගාවේ රෝග සහ පළිබෝධ පාලනය සම්බන්ධව ගොවීන්ගේ දැනුම හා භාවිතය වැඩිදියුණු කිරීම**

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව හා හිඟුරාන ප්‍රදේශයන්හි ගොවීන් 685 දෙනෙකු සඳහා රෝග සහ පළිබෝධ පාලනය සම්බන්ධව එක් දින පුහුණු වැඩසටහන් 02ක් පැවැත්වීම.

  - හිඟුරාන ක්ෂේත්‍ර නිලධාරීන් සහ ගොවීන් සඳහා රෝග සහ පළිබෝධ පාලනය සම්බන්ධව එක් දින පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

  - පැල්වත්ත, සියඹලාණ්ඩුව හා බඩල්කුඹුර ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් 235 දෙනෙකු සඳහා ආදර්ශන/පුහුණු සැසි 11ක් පැවැත්වීම.

- ඇඹිමලේ වැව්ලි සමාගමට අනුබද්ධ ක්ෂේත්‍ර නිලධාරීන් 20 දෙනෙකු සඳහා සුදු පත්‍ර රෝග වාහකයා හඳුනා ගැනීම සහ පාලනය කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේදී පැවැත්වීම.

- පැල්වත්ත, සියඹලාණ්ඩුව හා හිඟුරාන ප්‍රදේශයන්හි වගා බිම්වල සුදු පත්‍ර රෝගය, කළු දුඹුලු රෝගය සහ උක් වුල් කුඩිත්තා පාලනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ 140ක් සිදු කිරීම.

- කළු දුඹුලු රෝගය සම්බන්ධ උපදෙස් පත්‍රිකා 2000ක් ද, උක් වුල් කුඩිත්තා පිළිබඳ උපදෙස් පත්‍රිකා 1500ක් ද, ප්‍රරෝහ විදින පණුවා සම්බන්ධ පත්‍රිකා 1000ක් ද නැවත මුද්‍රණය කිරීම.

- සුදු පත්‍ර රෝගය, කළු දුඹුලු රෝගය, උක් වුල් කුඩිත්තා සහ ප්‍රරෝහ විදින පණුවා පිළිබඳ උපදෙස් පත්‍රිකා 2000ක් පමන ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර බෙදා හැරීම.

- **උක් ගොවීන්ගේ ව්‍යවසායකත්ව දැනුම හා කුසලතාවය වැඩිදියුණු කිරීම**

  - සෙවනගල, සියඹලාණ්ඩුව සහ බඩල්කුඹුර ප්‍රදේශයන්හි ගොවීන් සඳහා පුහුණු වැඩ සටහන් 10ක් පැවැත්වීම.

  - තෝරාගත් ගොවීන් 53 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම.

  - පැල්වත්ත ක්ෂේත්‍ර නිලධාරීන් 43 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම.

- **සීනි කර්මාන්තශාලා සහ අනෙකුත් අදාල ආයතනවල ඉල්ලීම පරිදි, පුහුණු වැඩසටහන් පැවැත්වීම/සේවා සැපයීම සහ ප්‍රදර්ශන පැවැත්වීම**

  - කිලිනොච්චියේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුබද්ධ සාමාජිකයින් 30 දෙනෙකු සඳහා උක් වගාව සම්බන්ධ තෙදින පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්වීම.

  - සෙවනගල, පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශයන්හි තෝරාගත් ගොවීන් අතර සිය ගෙවතුවල සිටුවීම සඳහා පොල් පැල බෙදා දීමේ වැඩසටහන පොල් වගා කිරීමේ මණ්ඩලය සහ අදාල සීනි කර්මාන්තශාලා අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

  - උක් පර්යේෂණ ආයතනයේ 2015 වාර්ෂික වාර්තාව සැකසීම සහ මුද්‍රණය කිරීම.

  - උක් පර්යේෂණ ආයතනයේ 2016 වාර්ෂික වාර්තාව සැකසීම සහ මුද්‍රණයට සූදානම් කිරීම.

  - "සාර ප්‍රභා ගිර" ගුවන් විදුලි වැඩසටහන් මාලාවෙහි උක් කර්මාන්තයට අදාල වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ වැඩසටහන් දෙකකට සම්පත් දායකයින් ලෙස සම්බන්ධ වීම.

  - ලංකා සීනි සමාගම (පැල්වත්ත) විසින් සංවිධානය කරන ලද ගොවි පුහුණු වැඩසටහන් 2ක දේශන පැවැත්වීම සහ ආදර්ශන සැසි පැවැත්වීම.

  - බුත්තල "විදාතා" මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ උක් වගා කර්ම සහ සැකසීම සම්බන්ධ එක් දින ගොවි පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

  - කොටියාගල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුබද්ධ සාමාජිකයින් 55 දෙනෙකු සඳහා උක් වගා කිරීම සම්බන්ධ එක් දින පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- උක් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ නිපුණතා ප්‍රවර්ධනය සහ ආකල්ප වෙනස් කිරීම යන මැයෙන් වූ එක් දින පුහුණු වැඩසටහන් 4ක් සම්බන්ධීකරණය කිරීම.

- පේරාදෙණිය, වයඹ, සබරගමුව විශ්වවිද්‍යාල සහ ඇක්වයිනාස් ආයතනයේ සිසුන් 190ක් සඳහා උක් වගා කිරීම සහ සැකසීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 4ක් සම්බන්ධීකරණය කිරීම.

- මොණරාගල තාක්ෂණ විද්‍යාලයේ සිසුන් 70 දෙනෙකු සඳහා උක් වගා කිරීම සහ සැකසීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම.

- මඩුල්ල සහ සියඹලාණ්ඩුව සිසුන් 140 දෙනෙකු සඳහා උක් වගාකිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීම.

- බුත්තල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සහ මොණරාගල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම්වලට සහභාගී වීම.

- මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ප්‍රදේශයේ උක් වගාකිරීම සම්බන්ධ පූර්ව-ශක්‍යතා අධ්‍යයනයට දායක වීම.

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ පැවති, ගෝලීය වෙනස්කම් සහ තිරසාරබව උදෙසා, ශ්‍රී ලංකාවේ පර්යේෂණ-ප්‍රතිපත්ති-තාක්ෂණ පිරිස්වල ධාරිතා සංවර්ධනයෙහිලා ව්‍යාපෘතීන්ගේ සොයාගැනීම් සම්ප්‍රේෂණය කිරීම යන මැයෙන් වූ පර්යේෂණ සම්මන්ත්‍රණයට සහභාගීවීම.

- අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුහුණුවන වැවිලිකරුවන් සඳහා වූ මූලික පාඨමාලාවට අදාලව දේශන 2ක් පැවැත්වීම. වීම.

**සංවර්ධන කටයුතු**

- **උක් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

**බදුල්ල දිස්ත්‍රික්කය**

- පස්සර ප්‍රදේශයේ ගොවීන් සඳහා උක් වගාකිරීම සහ උක් හකුරු නිපදවීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම.

- පස්සර ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය සහ ඇගයීම සඳහා ගොවි නියෝජිතයින් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්වීම.

- පස්සර ප්‍රදේශයේ කුඩා පරිමාණ අක්කර 0.5 ගොවි ක්ෂේත්‍ර 80ක තවාන්/ගුණන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම.

- උක් හකුරු නිපදවීම සම්බන්ධ උපදෙස් පත්‍රිකා 400ක් ගොවීන් සහ හකුරු නිපදවන්නන් අතර බෙදාදීම.

- බදුල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමට සහභාගී වීම.

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

- හඟුරන්කෙත සහ වලපනේ ප්‍රදේශයන්හි ගොවීන් සඳහා උක් වගාකිරීම සහ උක් හකුරු නිපදවීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 16ක් පැවැත්වීම.

- වලපනේ, සේරුපිටිය ප්‍රදේශයේ කුඩා පරිමාණ අක්කර 0.5 ගොවි ක්ෂේත්‍ර 70ක තවාන්/ගුණන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම.

- වලපනේ සහ හඟුරන්කෙත ප්‍රදේශවල උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා පැවැත්වීම.

- වලපනේ සහ හඟුරන්කෙත ප්‍රදේශවල උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා යෝජිත ඉඩම් පරීක්ෂා කිරීම සහ තෝරාගත් සේරුපිටිය ප්‍රදේශයේ ගොවීන්හට දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා උක් වගාකිරීමට ඇති විභවය පැහැදිලි කිරීම.
- උක් හකුරු නිපදවීම සම්බන්ධ උපදෙස් පත්‍රිකා 200ක් ගොවීන් අතර බෙදාදීම.

- **සෙවනගල, පැල්වත්ත සහ හිඟුරානෙහි, රෝග ආසාධිත උක් තවාන් ප්‍රතිස්ථාපනය කිරීම**

  - හෙක්ටයාර 12.5 ක මාතෘ තවාන් ක්ෂේත්‍ර සෙවනගල සහ උඩවලව ප්‍රදේශයන්හි ස්ථාපිතකොට අධීක්ෂණය කිරීම.

  - කන්තලේ සහ උඩවලව ස්ථාපිත කරන ලද හෙක්. 4 ක මාතෘ තවාන් නඩත්තු කිරීම.

# ප්‍රකාශන

- නිර්නාම (2017). උක් වගා කිරීමෙන් ලාභ ලබා ගන්න. පුවත් හසුන - 2017.

- ඩී. එන්. බලගල්ල, ඒ. විජේසූරිය, එන්. පී. රණතුංග සහ ඒ. එම්. එම්. එස්. පෙරේරා (2017). උක් ශාකයේ ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා පත්‍ර පටකයන්ගෙන් සෘජුව පැළ ලබා ගැනීමට ක්‍රමවේදයක්. Tropical Agriccultural Research, වෙළුම 29, පිටුව 7.

- කේ. ඒ. ඩී. කොඩිතුවක්කු සහ ඒ. පී. කීර්තිපාල (2017). උක්වල නිෂ්පාදනය, මිල සහ සීනි නිෂ්පාදනය කෙරෙහි බලපාන සාධක. Sugarcane Sri Lanka ජර්නලය-වෙළුම 3, උක් පර්යේෂණ ආයතනය, උඩවලව, ශ්‍රී ලංකාව.

- කේ. ඒ. ඩී. කොඩිතුවක්කු සහ ඒ. පී. කීර්තිපාල (2017). 2017/18 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ උක් වගාවේ ආර්ථික ඇගයීම. ආර්ථික ප්‍රකාශන පෙළ - අංක 17, උක් පර්යේෂණ ආයතනය, උඩවලව, ශ්‍රී ලංකාව.

- කේ. ඒ. ඩී. කොඩිතුවක්කු සහ ඒ. පී. කීර්තිපාල (2017). 2017/18 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් තරඟකාරී බෝග සමග වර්ෂා පෝෂිත සහ වාරි පෝෂිත තත්ව යටතේ උක් වගාවේ ලාබදායීතාවය. ආර්ථික ප්‍රකාශන පෙළ - අංක 18, උක් පර්යේෂණ ආයතනය, උඩවලව, ශ්‍රී ලංකාව.

- මානෙල් දාපනගේ සහ සුමංගල බාට් (2017). ජලය හිඟ ආතතීන්ට ඔරොත්තු දීමට වානිජ උක් ප්‍රභේද (සැකරුම් විශේෂ දෙමුහුම්) දක්වන්නාවූ කායික විද්‍යාත්මක ප්‍රතිචාරයන් - ශාක කායික විද්‍යා ඉන්දියානු ජර්නලය, පිටු 1-8.

- ඒ. එම්. එම්. එස්. පෙරේරා, ඩී. පී. එස්. ටී. පී. අත්තනායක සහ අරුණ විජේසූරිය (2017) - SSR සළකුණු කාරක භාවිතයෙන් *සැකරුම් ඔෆිසිනාරුම්* හි ජාන දර්ශ අතර ජානමය විවිධත්වය ඇගයීම. වයඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සම්මේලනය, වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවත්ත, ශ්‍රී ලංකාව.

- එච්. ඒ. එස්. වීරසිංහ, බී. ඩී. එස්. කේ. ආරියවංශ සහ ඒ. විජේසූරිය (2017) - උඩවලව, වාරි පෝෂිත තත්ව යටතේ සැකරුම් විශේෂ දෙමුහුම්වන එස්. එල්. 96 128 සහ එස්. එල් 96 328 උක් ප්‍රභේද, නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම්වලට දක්වන ප්‍රතිචාරය පිළිබඳ මූලික විශ්ලේෂණයක් - Sugarcane Sri Lanka ජර්නලය - වෙළුම 3, උක් පර්යේෂණ ආයතනය, උඩවලව, ශ්‍රී ලංකාව.

- ඒ. විජේසූරිය, එල්. බී. සී. ජයමාලි, ඒ. එම්. එම්. එස්. පෙරේරා සහ බී. ඩබ්ලිව්. විජේසූරිය (2017) - උක් (සැකරුම් විශේෂ දෙමුහුම්) ඇගයීම සඳහා ප්‍රශස්ත පාත්ති සහ නියැදි ප්‍රමානයන් - Sugarcane Sri Lanka ජර්නලය - වෙළුම 3, උක් පර්යේෂණ ආයතනය, උඩවලව, ශ්‍රී ලංකාව.

- එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන, ඒ. එල්. සී. ද සිල්වා සහ පී. ඒ. ඒ. චතුරංග (2017) - උක් වගා කිරීමේ දී අක්‍රමවත් ඉඩම්වල නෙර ලකුණු කිරීම සඳහා නව මෙවලමක් - 73වන වාර්ෂික සැසිය, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, කොළඹ, ශ්‍රී ලංකාව. පිටු 13




# පාලන හා මුදල් අංශය

# පාලන හා මුදල් අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය ඒ. පී. කීර්තිපාල<br>(කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි) | - | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි |
| ආචාර්ය ඩබ්ලිව්. ආර්. පී. විතාරම<br>(කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි) | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ) |

## පාලන අංශය

| | | |
|---|---|---|
| පී. කේ. එන්. ප්‍රියදර්ශන මහතා<br>(විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන- විශේෂ, සී.බී.ඒ.) | - | සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| ආචාර්ය සී. එපිටවල<br>(දර්ශනශූරි, ඩිප්ලෝමා - මා.ස..ක) | - | පරිපාලන නිලධාරි |
| ටී. ඒ. ඩී. එම්. පී. ජයතිලක මිය | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| ජේ. කේ. චන්ද්‍රලතා මිය | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| ටී. එම්. කේ. සේනාධීර මිය | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| එම්. එම්. අයි. එම්. කේ. මැණික්කඩවර මෙනවිය | - | කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| එම්. ඒ. ආර්. සමරසේකර මෙනවිය | - | කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| ඕ. යූ. සුභසිංහ මිය | - | කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| ඩබ්ලිව්. ඒ. සමීර මධුශංක මහතා | - | කළමනාකරණ සහකාර<br>(ලිපිකරු සහ යතුරු ලියනය) |
| ඒ. කේ. රත්නායක මිය | - | දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී |
| අයි. ඔස්ටින් පෙරේරා මහතා | - | රියදුරු |
| එස්. එල්. පීරිස් මහතා | - | රියදුරු |
| එච්. ඒ. යූ. එස්. ප්‍රේමරත්න මහතා | - | රියදුරු |
| ජේ. පී. එස්. පී. කරුණාතිලක මහතා | - | රියදුරු |
| ටී. පී. කේ. ජයරත්න මහතා | - | රියදුරු |
| එස්. ඒකනායක මහතා | - | රියදුරු |
| එච්. එස්. ඒ. සුසන්ත කුමාර මහතා | - | රියදුරු |
| පී. ඩබ්ලිව්. එම්. පී. එස්. මානවඩු මහතා | - | රියදුරු |
| ඒ. එම්. විජයරත්න බණ්ඩා මහතා | - | රියදුරු |
| ඩබ්ලිව්. එම්. ඒ. කේ. ප්‍රියශාන්ත මහතා | - | රියදුරු |
| කේ. දුමින්ද මංජුල අබේසිරි මහතා | - | රියදුරු |

**නඩත්තු ඒකකය**

| | | |
|---|---|---|
| ජී. එස්. කේ. දහනායක මහතා (විද්‍යාවේදී) | - | වැඩ අධිකාරී |
| ඩී. එච්. එස්. විජේසිංහ මිය | - | වැඩ පරීක්ෂක |
| ජී. ගමගේ මහතා | - | විදුලි කාර්මික |
| ආර්. පාලමුරේ මහතා | - | විදුලි කාර්මික |
| ඩී. ඩබ්ලිව්. එස්. චින්තන මහතා | - | වඩු කාර්මික |
| ආර්. පී. කුලතුංග මහතා | - | වඩු කාර්මික |
| ඩී. එච්. ධර්මදාස මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |
| එච්. පී. චන්ද්‍රවංශ මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |
| කේ. එච්. විරරත්න මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |

**ගිණුම් ඒකකය**

| | | |
|---|---|---|
| ඩී. එම්. ජේ. එන්. දිසානායක මිය (වාණිජවේදී, විද්‍යාපති) | - | ගණකාධිකාරී |
| අයි. බී. කෝදාගොඩ මහතා (වාණිජවේදී) | - | ගිණුම් නිලධාරී |
| ටී. එම්. එල්. එස්. තෙන්නකෝන් මහතා | - | පොත් තබන්නා |
| ජී. එම්. එස්. නන්දදේව | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ඒ. කේ. අමරකෝන් මිය | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ඩී. එම්. පී. නික්ෂන් මහතා | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ටී. එස්. වීරසිංහ මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ජී. ඩී. එන්. එම්. අනුරුද්ධිකා මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |

**ප්‍රසම්පාදන ඒකකය**

| | | |
|---|---|---|
| එම්. පී. ආර්. කුමාර මහතා (බී.බී. කළමනාකරණ) | - | ප්‍රසම්පාදන නිලධාරී (2017.05.18 දක්වා) |
| එස්. එස්. චතුරානි මිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ඒ. පී. යූ. එස් ද සිල්වා මහතා | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |
| ඩබ්ලිව්. පී. එස්. මැණිකේ මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |

**ගබඩාව**

| | | |
|---|---|---|
| ආර්. පී. එස්. නිරෝශන මහතා | - | ගබඩා භාරකරු |
| ටී. රංජිත් පීරිස් මහතා | - | කළමනාකරණ සහකාර (ගිණුම්) |

**අභ්‍යන්තර විගණන ඒකකය**

| | | |
|---|---|---|
| එස්. පී. වයි. මුණීන්ද්‍ර මහතා (අයි.සී.ඒ - අන්තර්මාධ්‍ය, එම්.ඒ.ඒ.ටී) | - | අභ්‍යන්තර විගණක |
| එල්. එස්. දයානන්ද මහතා | - | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්) |

**වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යන්හි සාරාංශය**

- බත්තරමුල්ල පිහිටි කොළඹ කාර්යාලය, තලංගම දකුණ, පාලාවත්ත පාර, අංක 21 ඒ දරණ ස්ථානයට ගෙන යාම.

- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, පර්යේෂණ නිලධාරී තනතුරු පුරප්පාඩු දෙකක්, සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී, තාක්ෂණ නිලධාරී තනතුරු දෙකක් සහ කළමනාකරණ සහකාර (ගිණුම්) තනතුරු දෙකක් ලෙස පුරප්පාඩු අටක් පිරවීම.
- ආයතනයේ ආරක්ෂක කටයුතු සඳහා 2017 අගෝස්තු 01 සිට 2018 ජූලි 31 දින දක්වා ඩබ්ලිව්. ඊ. ආරක්ෂක සේවා (පුද්) සමාගමේ සේවය ලබා ගැනීමට කටයුතු කිරීම.
- අයවැය ලේඛනය, වාර්ෂික ගිණුම් සහ ප්‍රගතිය පිළිබඳ වාර්තා සැකසීම.
- ආයතනයේ සංවර්ධන සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- එදිනෙදා පරිපාලන, පිරිස් පාලන, නඩත්තු කටයුතු, සුබසාධන කටයුතු සහ ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධනවල අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩල පුහුණු කිරීම.

## කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සහ අභිප්‍රේරණය

### බඳවාගැනීම්

| | | | |
|---|---|---|---|
| ආචාර්ය ඩබ්ලිව්. එල්. අයි. විජේසේකර | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2017.01.02. |
| ඒ. පී. කරුණාතිලක මහතා | - | සංවර්ධන නිලධාරී | 2017.01.09 |
| පී. ඒ. ලක්මා මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) | 2017.01.09 |
| අයි. පී. මාණවඩු මහතා | - | තාක්ෂණ නිලධාරී | 2017.07.04 |
| වයි. ඒ. පී. කේ. දයාසේන මහතා | - | පර්යේෂණ නිලධාරී | 2017.07.06 |
| එස්. එම්. ඒ. ඩී. කුමාරි මෙනවිය | - | තාක්ෂණ නිලධාරී | 2017.11.15 |
| ඩබ්ලිව්. පී. එස්. මැණිකේ මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) | 2017.11.15 |
| එම්. පී. පී. එන්. සෙව්වන්දි | - | කළමනාකරණ සහකාර (ගිණුම්) | 2017.01.09 |

## 2017 වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැටුම

### විශ්‍රාම ගැනීම්

| | | | |
|---|---|---|---|
| ඩබ්ලිව්. ඒ. ගුණපාල මහතා | - | පොදු කම්කරු | 2017.03.31 |
| ජේ. වික්‍රමාරච්චි මහතා | - | පොදු කම්කරු | 2017.05.02 |
| කේ. රංජිත් මහතා | - | පොදු කම්කරු | 2017.11.23 |
| එම්. සිවපාලන් මහතා | - | රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක | 2017.12.24 |

### ඉල්ලා අස්වීම්

| | | | |
|---|---|---|---|
| එස්. එම්. ඒ. ඩී. එන්. ඩී. සෙනෙවිරත්න | - | තාක්ෂණ නිලධාරී | 2017.04.04 |
| එච්. පී. ආර්. කුමාර මහතා | - | ප්‍රසම්පාදන නිලධාරී | 2017.05.18 |
| ආචාර්ය ඩබ්ලිව්. එල්. අයි. විජේසේකර | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 2017.05.22 |
| පී. ඒ. ලක්මා මෙනවිය | - | කළමනාකරණ සහකාර (ගිණුම්) | 2017.07.04 |

## කාර්ය මණ්ඩල පුහුණුවීම් සහ චාරිකා (විදේශීය)

1 සංවර්ධන නිලධාරී, එස්. එන් වික්‍රමසිංහ මහතා 2017 පෙබරවාරි 27 සිට මාර්තු 17 දක්වා ඉන්දියාවේ හයිඩෙරාබාද් හි පැවති කෘෂි ව්‍යාපාරයන්හි ව්‍යවසායකත්ව සංවර්ධන ක්‍රමෝපායන් සම්බන්ධ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

2 සංවර්ධන නිලධාරී, එම්. කේ. පී. සී. ගුණවර්ධන මහතා 2017 මැයි 03 සිට ජුනි 01 දක්වා චීනයේ පැවති ආනයනික සහ අපනයන කෘෂි නිෂ්පාදනවල රෝග ශා පලිබෝධ සම්බන්ධ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

3 පර්යේෂණ නිලධාරීන්වන, පී. ඒ. ඒ. චතුරංග ෂහ බී. ආර්. කුලසේකර යන මහත්වරුන් 2017 අප්‍රේල් මස 28 සිට මැයි 18 දක්වා චීනයේ යුනාන් උක් පර්යේෂණ ආයතනයෙහි පැවති උක් ශාකයේ මූල පද්ධති පර්යේෂණ සම්බන්ධ පුහුණුවකට සහභාගී විය.

4 සභාපති කේ. ඒ. එෆ්. කරුණාසේන මහතා 2017 ජුනි 17 සිට 25 දක්වා එල් සැල්වදෝරයෙහි පැවති 51 වන අන්තර්ජාතික සීනි සම්මන්ත්‍රණයට සහභාගී විය.

5 ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය එම්. එස්. පෙරේරා 2017 අගෝස්තු 21 සිට 26 දක්වා බ්‍රසීලයේ පැවති "FENASUCRO & AGROCANE" ප්‍රදර්ශනයට සහභාගී විය.

6 සභාපති කේ. ඒ. එෆ්. කරුණාසේන සහ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ඒ. පී. කීර්තිපාල යන මහත්වරුන් 2017 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 02 කාලය තුළ රාජකාරීමය ගිවිසුම්වලට එළඹීම සඳහා චීන මහජන සමුහාණ්ඩුවේ යුනාන් කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය සහ යුනාන් උක් පර්යේෂණ ආයතනයෙහි චාරිකාවක නිරත විය.

7 ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ. එල්. සී. ද සිල්වා සහ පර්යේෂණ නිලධාරීන්වන එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන සහ පී. ඒ. ඒ. චතුරංග යන මහත්වරුන් 2017 සැප්තැම්බර් 24 සිට ඔක්තෝබර් 01 දින දක්වා එක්සත් රාජධානියේ පැවති ප්‍රභාසංස්ලේෂණ සහ ලයිසිමීටර් පද්ධති පිළිබඳ පුහුණුවකට සහභාගී විය.

8 පර්යේෂණ නිලධාරී කේ. එච්. ඩී. අබේරත්න සහ ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී ඒ. එස්. එම්. ඒ. ප්‍රනාන්දු යන මහත්වරුන් 2017 ඔක්තෝබර් 15 සිට 28 දක්වා තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ පැවති කෘෂිකාර්මික ඩ්‍රෝන භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

9 පරිපාලන නිලධාරී ආචාර්ය සී. එපිටවල, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්) පී. එම්. එස්. නන්දදේව මහතා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය) ජේ. කේ. චන්ද්‍රලතා යන මහත්ම මහත්මීන් 2017 ඔක්තෝබර් 15 සිට 19 දක්වා මැලේසියාවේ පැවති විධායක නිපුණතා සංවර්ධන පුහුණු වැඩමුළුවකට සහභාගී විය.

10 ගිණුම් නිලධාරී අයි. බී. කෝදාගොඩ මහතා 2017 දෙසැම්බර් 02 සිට 06 දක්වා මැලේසියාවේ පැවති විධායක නිපුණතා සංවර්ධන පුහුණු වැඩමුළුවකට සහභාගී විය.

11 සහකාර අධ්‍යක්ෂ (පාලන) පී. කේ. එන්. ප්‍රියදර්ශන මහතා 2017 දෙසැම්බර් මස 10 සිට 16 දක්වා තායිලන්තයේ බුරාපා විශ්ව විද්‍යාලයේ පැවති ව්‍යවසායකත්ව ව්‍යාපෘති සහ සංවිධාන කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩසටහනකට සහභාගී විය.

**දිගු කාලීන පුහුණුවීම් (දේශීය)**

1 ආර්ථික විද්‍යා, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශයෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී බී. ඩී. එස්. කේ ආරියවංශ මහත්මිය සහ බෝග පෝෂණ අංශයෙහි පර්යේෂණ නිලධාරී එච්. ඒ. එස්. වීරසිංහ මහතා සිය ආචාර්ය උපාධිය සඳහාවන අධ්‍යයන කටයුතු පේරාදෙණිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

2 බෝග ආරක්ෂණ අංශයෙහි පර්යේෂණ නිලධාරී ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරි මහත්මිය සිය දර්ශනපති උපාධිය සඳහාවන අධ්‍යයන කටයුතු පේරාදෙණිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි 2017 පෙබරවාරි 01 දින සිට ආරම්භ කරන ලදී.

**කෙටි කාලීන පුහුණුවීම්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ (දේශීය)**

1 තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී ඩී. ජී. ඩබ්ලිව්. පොත්තවෙල මහතා සහ පර්යේෂණ නිලධාරී එස්. එම්. ටී. ඒ. මාරලන්ද මහත්මිය 2017 අප්‍රේල් 27 දින කොළඹ කාර්මික තාක්ෂණ ආයතනයෙහි පැවති "Work-Life Balance for Scientists: Key to Success" යන මැයෙන් වූ එක් දින වැඩමුළුවකට සහභාගී විය.

2 අදාල සියළුම නිලධාරීන්, 2017 මැයි 30 සහ ජුනි 15 දෙදින ඇඹිලිපිටිය සරත්චන්ද්‍ර හෝටලයේ දී, පියතිස්ස රණසිංහ මහතා විසින් මෙහෙයවන ලද රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ දෙදින පුහුණු වැඩටහනකට සහභාගී විය.

3 සියළුම විද්‍යාත්මක නිලධාරීන්, 2017 ජුලි මස 04 සහ 05 දෙදින උක් පර්යේෂණ ආයතනයේ දී, මහාචාර්ය ආර්. ඕ. තට්ල් විසින් මෙහෙයවන ලද කෘෂිකාර්මික පර්යේෂණවලදී ජෛවමිතික භාවිතයන් සම්බන්ධ පුහුණු වැඩසටහනකට සහභාගී විය.

4 විදුලි කාර්මික, රංජිත් පාලමුරේ මහතා 2017 ජුලි මස 13 සිට 16 දක්වා ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයෙහි පැවති ස්වයංක්‍රීය විදුලි පද්ධති නඩත්තුව පිළිබඳ පුහුණුවකට සහභාගී විය.

5 ගබඩා භාරකරු, ආර්. පී. එස්. නිරෝෂණ සහ කළමනාකරණ සහකාර (ගිණුම්), ඒ. පී. යූ. එස්. ද සිල්වා යන මහත්වරුන් 2017 ජුලි සම 27 සහ 28 දෙදින සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලෙහි පැවති කාර්යාල උපකරණ පාලනය සම්බන්ධ වැඩමුළුවකට සහභාගී විය.

6 පොත් තබන්නා, ටී. එම්. එල්. එස්. තෙන්නකෝන් මහතා සහ කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) අයි. එම්. කේ. මැණික්කඩවර සහ එම්. ඒ. ආර්. සමරසේකර යන මහත්මීන් 2017 ජුලි මස 24 සිට 26 දක්වා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලෙහි පැවති ලිපිකාර කුසළතා සම්බන්ධ තෙදින වැඩමුළුවකට සහභාගී විය.

7 කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) එම්. ඒ. ආර්. සමරසේකර මහත්මිය 2017 ජුලි 28 සිට සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල විසින් මෙහෙයවන ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ තෙමස් සහතික පත්‍ර පාඨමාලාවකට සහභාගී විය.

8 ගොවිපළ අධිකාරී, පී. ආර්. බී. චන්ද්‍රසේන මහතා 2017 ජුලි 29 සිට සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල විසින් මෙහෙයවන ලද මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සිවු මස් සහතික පත්‍ර පාඨමාලාවකට සහභාගී විය.

9 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්), එල්. එස්. දයානන්ද මහතා 2017 අගෝස්තු 03 දින සීමාසහිත ජර්ෆ් සර්විස් පුද්ගලික සමාගමෙහි පැවති අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුවකට සහභාගී විය.

10 කළමනාකරණ සහකාර, ඩබ්ලිව්. ඒ. එස්. මධුසංක 2017 අගෝස්තු 11 දින සිට ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් මෙහෙයවන ලද ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවකට සහභාගී විය.

11 පොදු කම්කරුවන්වන (කාර්යාල) එන්. ඒ. එච්. ඩබ්ලිව්. තිලකරත්න සහ කේ. ඒ. විපුල් කුමාරසිරි යන මහත්වරුන් 2017 අගෝස්තු 25 දින ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් මෙහෙයවන ලද ආයතනයක ඵලදායීතාවය ඉහල නැංවීමේලා කාර්යාල සහායකයන්ගේ කාර්ය භාරය යන මැයෙන් වූ පුහුණුවකට සහභාගී විය.

12 තාක්ෂණ නිලධාරී, එම්. ඒ. ආර්. අයි. පෙරේරා මහත්මිය 2017 අගෝස්තු 14 සිට 29 දක්වා කාර්මික තාක්ෂණ ආයතනයයෙහි පැවැති ආහාර ක්ෂුද්‍ර ජීව විද්‍යා ශිල්පක්‍රම පිළිබඳ වැඩමුළුවකට සහභාගී විය.

13 ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය එම්. එස්. පෙරේරා සහ තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල සහ පර්යේෂණ නිලධාරීන්වන එච්. ඒ. එස්. වීරසිංහ, බී. ආර්. කුලසේකර සහ කේ. පී. වික්‍රමසිංහ යන මහත්වරුන් 2017 සැප්තැම්බර් 11 දින කොළඹ රසායනවිද්‍යා ආයතනයෙහි පැවති ජාතික සංවර්ධනයේලා සීනි කර්මාන්තයෙහි උකහා නොගත් විභවය යන මැයෙන් වූ වැඩමුළුවකට සහභාගී විය.

14 රියදුරු ඩබ්ලිව්. එම්. ඒ. කේ. ප්‍රියශාන්ත මහතා 2017 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයෙහි පැවති විද්‍යාත්මක, ආර්ථික සහ සුපරික්ෂාකාරී වාහන ධාවනය සම්බන්ධ පුහුණුවකට සහභාගී විය.

15 කාර්යාල කාර්ය සහායක/පණිවුඩකරු, එච්. එම්. ලසන්ත මහතා 2017 නොවැම්බර් 27 සහ 28 දෙදින සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල විසින් මෙහෙයවන ලද කාර්යාල කාර්ය සහායකයන්ගේ ආකල්ප සහ ඔවුන්ගේ රාජකාරිය යන මැයෙන් වූ පුහුණුවකට සහභාගී විය.

16 සහකාර අධ්‍යක්ෂ (පාලන), පී. කේ. එන්. ප්‍රියදර්ශන මහතා 2017 දෙසැම්බර් 04 සහ 05 දෙදින සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලෙහි පැවති විනය ක්‍රියාමාර්ග සම්බන්ධ පුහුණුවකට සහභාගී විය.

17 පර්යේෂණ නිලධාරී, එම්. පී. පී. එන්. සෙව්වන්දි මෙනවිය, 2017 දෙසැම්බර් 21 දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් මෙහෙයවන ලද ව්‍යාපෘති යෝජනා සැකසීම සම්බන්ධ වැඩමුළුවකට සහභාගී විය.

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2017

උක් පර්යේෂණ ආයතනයේ 2017 වර්ෂයට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පවත්වා ඇත. මෙම වර්ෂයේදී ද ආයතනයේ පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය මෙන්ම පරිපාලන හා ගිණුම් අංශයේ ප්‍රගතිය සහ ගැටළු පිළිබඳව සාකච්ඡාවට ලක් කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් යොමු කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සාකච්ඡාවට භාජනය කරමින් අදාල කරුණු කමිටු වාර්තාවලට අන්තර්ගතකර එම වාර්තා පාලක මණ්ඩලය වෙත යොමු කිරීමත්, එහිදී එම කරුණු තව දුරටත් සාකච්ඡා කිරීම තුලින් ආයතනයේ පරිපාලනමය සහ ගිණුම් අංශයේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට හැකි වීමත් විශේෂයෙන් රජයේ විගණකවරුන් විසින් යොමු කරන ලැබූ විගණන විමසුම් සහ ඒ සඳහා ලබා දෙන ලද පිළිතුරු සාකච්ඡාවට භාජනය කිරීමත් සහ ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම තුලින් විගණන ගැටළු අවමකර ගැනීමට හැකිවිය.

ඊට අමතරව, ආයතනයේ ස්ථාපිතකර ඇති අභ්‍යන්තර පාලන පද්ධතීන්ට හා රජයේ චක්‍රලේඛයන්ට අනුකූලව ආයතනීය කටයුතු පවත්වාගෙන යාමටත් පාලක මණ්ඩලයට තීන්දු තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙමින් ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය භාරය නොපිරිහෙලා ඉටුකර ඇත.

එස්. පී. වයි. මුනීන්ද්‍ර
ලේකම්/කැඳවුම්කරු

2018 පෙබරවාරි 15 දින

# විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

## උක් පර්යේෂණ ආයතනය
## 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| වත්කම් | සටහන් | 2017 | 2017 | 2016 | 2016 |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 1 | | 267,629,949.92 | | 255,143,450.98 |
| | | | 267,629,949.92 | | 255,143,450.98 |
| **ජංගම වත්කම්** | | | | | |
| පාරිභෝගික තොගය | 2 | 22,899,519.36 | | 21,526,424.72 | |
| ජීව විද්‍යාත්මක තොගය | | 338,100.00 | | 252,695.00 | |
| ණයවර ලිපි සඳහා අත්තිකාරම් | | 4,221,623.09 | | 22,365,615.01 | |
| නොනිමි වැඩ | | 250,000.00 | | 250,000.00 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 3 | 44,387,389.61 | | 82,601,202.03 | |
| ආයෝජන (කෙටි කාලීන) | 4 | 152,329,680.56 | | 167,913,141.77 | |
| කලින් ගෙවීම් සහ වෙනත් තැන්පතු | 5 | 883,900.74 | | 653,900.74 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 6 | 18,616,140.74 | 243,926,354.10 | 17,696,751.78 | 313,259,731.05 |
| **මුළු වත්කම්** | | | **511,556,304.02** | | **568,403,182.03** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | 7 | 20,686,978.53 | | 5,977,087.41 | |
| උපචිත වියදම් | 8 | 3,682,401.92 | 24,369,380.45 | 5,053,913.82 | 11,031,001.23 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විලම්භිත ආදායම් | | | | (5.62) | (5.62) |
| වෛද්‍යාධාර සඳහා වෙන් කිරීම් (උප ලේඛන 9) | | 3,108,344.90 | | 3,150,030.84 | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | | 300,000.00 | | 300,000.00 | |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | | 367,839.81 | | 367,839.81 | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීම්(උප ලේඛන 10) | | 60,506,694.00 | 64,282,878.71 | 50,961,660.50 | 54,779,531.15 |
| **මුළු වගකීම්** | | | **88,652,259.16** | | **65,810,532.38** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **422,904,044.86** | | **502,592,644.03** |
| සංචිත - සමුච්චිත අරමුදල | | 287,574,935.55 | | | 279,064,744.56 |
| | | | | | 88,198,790.16 |
| ප්‍රත්‍යාගණ සංචිත | | 135,329,109.31 | | 135,329,109.31 | 135,329,109.31 |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | **422,904,044.86** | | **502,592,644.03** |

මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඉදිරිපත් කිරීම ආයතනය සතු කාර්යභාරයක් මෙන්ම අන්තර්ගත තොරතුරුවල වගකීමද ආයතනය සතු වේ. ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක සිට දක්වා සහ සටහන් පිටු අංක සිට දක්වා මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි

මෙම මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලය විසින් අනුමතකොට ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරමු

| | | |
|---|---|---|
| **කේ ඒ එෆ් කරුණාසේන** | **ආචාර්ය ඒ පී කීර්තිපාල** | **ඩී එම් ජේ එන් දිසානායක** |
| **සභාපති** | **අධ්‍යක්ෂක ප්‍රධාන විධායක නිලධාරී** | **ගණකාධිකාරී** |

## උක් පර්යේෂණ ආයතනය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වසර සඳහා මුල්‍යමය කාර්යසාධන ප්‍රකාශනය

| විස්තරය | | සටහන් | 2017 වර්ෂය | 2016 වර්ෂය |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| භාණ්ඩාගාර අරමුදල් | ප්‍රාග්ධන | | 17,700,000.00 | 53,000,000.00 |
| | පුනරාවර්තන | | 205,130,000.00 | 250,000,000.00 |
| ව්‍යාපෘති අරමුදල් | | | 10,000,000.00 | 12,000,000.00 |
| දේශීය නිෂ්පාදනය මත සෙස් (අමතර සටහන් 1.2) | | | 4,484,550.00 | 1,437,670.00 |
| වෙනත් ආදායම් | | 10 | 22,678,341.63 | 23,038,027.14 |
| ප්‍රාග්ධන අරමුදල් මිලදී ගැනීම සඳහා | | | | 50,000,000.00 |
| | | | **259,992,891.63** | **389,475,697.14** |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්ය මණ්ඩල ගෙවීම් | | 11 | 179,771,941.65 | 179,594,282.69 |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | | | 2,344,695.63 | 2,513,622.20 |
| විදේශ ගමන් | | | 7,621,383.46 | 787,291.65 |
| සැපයුම් හා පාරිභෝගික භාවිතයන් | | 12 | 5,195,863.14 | 3,862,315.28 |
| නඩත්තු | | 13 | 28,992,400.36 | 17,384,252.06 |
| ගිවිසුම්ගත සේවා | | 14 | 36,744,192.10 | 12,747,881.56 |
| පර්යේෂණ සහ සංවර්ධන | | 15 | 12,076,662.94 | 27,402,552.03 |
| ක්ෂය කිරීම් | | | 55,276,233.43 | 44,624,297.78 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 16 | 11,265,566.16 | 11,877,079.08 |
| අඩමාණ ණය | | | | 367,839.81 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | **339,288,938.87** | **301,161,414.14** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු අතිරික්තය** | | | **(79,296,047.24)** | **88,314,283.00** |
| මුල්‍ය පිරිවැය | | | 106,364.12 | 115,492.84 |
| **මුළු මෙහෙයුම් නොවන ආදායම්** (වියදම් ) | | | **(79,402,411.36)** | **88,198,790.16** |
| අසාමාන්‍ය අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය (හිඟය) | | | | |
| | | | **(79,402,411.36)** | **88,198,790.16** |

මෙම මුල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඉදිරිපත් කිරීම ආයතනය සතු කාර්යභාරයක් මෙන්ම අන්තර්ගත තොරතුරුවල වගකීමද ආයතනය සතු වේ. ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක සිට දක්වා සහ සටහන් පිටු අංක සිට දක්වා මුල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

මෙම මුල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලය විසින් අනුමතකොට ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරමු.

| | | |
|---|---|---|
| **කේ. ඒ. එෆ්. කරුණාසේන** | **ආචාර්ය ඒ. පී. කීර්තිපාල** | **ඩී. එම්. ජේ. එන්. දිසානායක** |
| **සභාපති** | **අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී** | **ගණකාධිකාරී** |

## උක් පර්යේෂණ ආයතනය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## උක් පර්යේෂණ ආයතනය

| විස්තරය | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ අතිරික්තය / (හිඟය )** | **(79,402,411)** | **88,198,790** |
| **මුදල් නොවන සංචලනයන්** | | |
| ක්ෂය | 55,276,233 | 44,624,298 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 9,545,034 | -11,690,136 |
| වෛද්‍යාධාර සඳහා වෙන්කිරීම් | (41,686) | 229,298 |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | - | 200,000 |
| පෙර වර්ෂයේ ගැලපීම් | 296,232 | 3,922,310 |
| ජීව වත්කම් කපා හැරීම | 85,405 | -27,494 |
| විලම්භිත ආදායම් | - | -10 |
